# වර්තමාන ශ්‍රී ලංකා සමාජයේ තරුණ භික්ෂූන් වහන්සේ

(වර්ගීකරණ, සමාජ ආකල්ප, අවනතීන්, ඊට හේතු හා යෝජනා)

වැලිපිටියේ ඉන්ද්‍රානන්ද හිමි

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සමාජයේ දැඩි අවධානයටත් සාකච්ඡාවටත් බඳුන් වන දෙපිරිසක් වශයෙන් භික්ෂුව හා තරුණයා හඳුනාගත හැකිය.පොදුවේ සාමාන්‍ය ගිහි සමාජයේ සිටින තරුණ පිරිසේ ක්‍රියාකාරිත්වය, හැසිරීම්, සිතුම් පැතුම් හා ආකල්ප ආදිය තත් සමාජයේ පැවැත්මට බලපාන්නේ යම්සේද එසේම තරුණ භික්ෂූන් වහන්සේගේ හැසිරීම, ක්‍රියාකාරිත්වය, සිතුම් පැතුම් හා ආකල්ප භික්ෂු සමාජයේ පැවැත්මට වැදගත් බලපෑමක් එල්ල කරයි. ගිහි තරුණයාට මුහුණදීමට සිදුවන අභියෝගවලට සාපේක්ෂව තරුණ භික්ෂූන් වහන්සේටද කාලානුරූපව පැනනැගුණු නොයෙක් අභියෝගවලට මුහුණදීමට සිදුවී ඇත. එහෙත් එසේ කාලානුරූපව තරුණ භික්ෂුව මුහුණදෙන අභියෝග, ගැටලු හෝ ප්‍රශ්න පිළිබඳ අමතක කර හෝ නොසලකාහැර භික්ෂු සංස්ථාවේ ප්‍රගමනයක් අපේක්ෂා කිරීම අපහසුය. තරුණ භික්ෂුව කෙරෙහි පවතින සමාජ ආකල්පයේ යම් දුර්වල හෝ අයහපත් අංශ හඳුනාගත හැකි වන්නේ ඒවා පිළිබඳ කෙරෙන විධිමත් සාකච්ඡාවකින් හෝ පරීක්ෂාවකින් පමණි. ඒ අනුව මෙම ලිපියේදී බලාපොරොත්තු වන්නේ 'තරුණ භික්ෂු සමාජය'යන තේමාවට කේන්ද්‍රගත වෙමින් වර්තමානයේ තත් සමාජයේ පවතින විවිධ ප්‍රවණතාවන්, තත්ත්වයන් හා ඒවා මගහරවා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග කවරේදැයි විමසීමටයි. මෙහිදී හැකි සෑම විටම බුද්ධ දේශනාව පාදක කර ගැනීමට අපේක්ෂා කෙරෙන අතර එමගින් සැමට පිළිගත හැකි විසඳුම් වෙත අවධානය යොමු කිරීමට අදහස් කෙරේ. 'තරුණකාලය' පිළිබඳ මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව ආදි විෂයවලදී විවිධ වයස්

පරාසයන් සඳහන් කරමින් නිර්වචනය කර තිබුණද මෙහිදී වයස අවුරුදු 16 - 40 අතර භික්ෂූන් 'තරුණ භික්ෂුව' යන කොටස යටතේ ගනු ලැබේ. ඊට හේතුව මෙම කාල පරාසය තුළභික්ෂූන් වහන්සේගේ ජීවිතයේ ප්‍රබෝධවත්ම කාල සීමාව වශයෙන්ද සමාජ ක්‍රියාකාරිත්වය ප්‍රබලවම ඉස්මතු වන කාලසීමාව වශයෙන්ද සැලකීමයි.

## බුදුසසුන හා තරුණ භික්ෂූන් වහන්සේ

බුදුරජාණන් වහන්සේගේ දේශනාව ප්‍රධාන වශයෙන් ඉලක්ක වූයේ ප්‍රඥාවන්තයන් හටය.[1] එවැනි පසුබිමක බාල, තරුණ, මහලු යනාදි වශයෙන් වෙන් කොට සලකා දම් දෙසීමක් උන්වහන්සේගේ නොවීය. ඊට හේතුව ඒ සියලු දෙනාට වෙනසකින් තොරව යථාර්ථය අනාවරණය කිරීමේ අවශ්‍යතාවයි. යථාර්ථයට බාල, තරුණ, මහලු වශයෙන් වයස් පරතර අනුව සිදුවන බෙදීමක් නොමැත. එහෙත් භික්ෂු සංස්ථාවේ සමාරම්භය පිළිබඳ විමසීමේදී පැහැදිලි වන්නේ එය සපුරාම තරුණ පිරිසකගේ මූලිකත්වයෙන් සිදුවූවක් බවයි.මේ බව කරුණු සහිතව පැහැදිලි කරගැනීම වැදගත්ය. වයස අවුරුදු විසිනවයේදී ගිහිගෙයින් නික්මුණු සිදුහත් බෝසතුන් වසර හයක ව්‍යායාමය ඇවෑමෙන්, එනම්, අවුරුදු තිස්පහේදී සම්බුද්ධත්වයට පත්වූයේය. අරියපරියේසන සූත්‍රයේදී බුදුරදුන් විසින්ම පවසන්නේ සුන්දර යෞවන සමයේදී තමන් ගිහිගෙයින් නික්මුණු බවයි. "මහණෙනි, ඒ මම පසුකාලයෙහි ළදරු වූයෙම්ම ඉතා කළු කෙස් ඇත්තෙම් පළමු වන වයස වූ සොඳුරු යොවුනෙන් යුක්ත වූයෙම්, නොකැමති වූ කඳුළු පිරුණු මුහුණ ඇති මව්පියන් හඬද්දී කෙස්රවුළු බා කහවත් හැඳ ගිහිගෙ යින් නික්ම පැවිද්දට පැමිණියෙමි."[2] යනුවෙනි.පස්වග මහණුන්ගෙ න් අනතුරුව සසුනට එකතු වන්නේ යස නමැති 'කුලපුත්‍රයෙක්' හා ඔහුගේ මිතුරන් පනස්හතර දෙනෙකි. අනුක්‍රමයෙන් දියුණු වූ සංඝ සමාජයේ බහුතරයක් සිටියේ තරුණ භික්ෂූන් යැයි සිතිය හැකිය.එපමණක් නොව, සංඝ සංස්ථාව තවදුරටත් ප්‍රසාරණය කරමින් එහි සාමාජිකයන් බවට පත්වන භද්දවග්ගිය නමැති 'කුමාරවරුන්' පිරිසද මෙහිදී වැදගත් වේ. ඔවුන් බුදුරදුන්ට හමුවන්නේ තමන් සමග සතුටු වීමට පැමිණි වේශ්‍යාවන් අතර සිටි

එක් තැනැත්තියකගේ නොමනා ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙනි. තවත් අවස්ථාවක 'ගිරග්ග සමජ්ජ' නමැති නාට්‍යයක් නැරඹීමට ගිය කෝලිත උපතිස්ස නමැති බමුණු කුමාරවරුන් දෙදෙනා එය නැරඹීමෙන් අනතුරුව සිය ජීවිත පැවැත්ම පිළිබඳ සිතාබලා දෙදෙනාගේම කැමැත්ත හා එකඟතාව මත සත්‍ය සොයාගෙ ාස් අස්සජී මහරහතුන්ගේ මගපෙන්වීම මත බුදුරදුන් වෙත එළඹ සාරිපුත්ත, මොග්ගල්ලාන යනුවෙන් පැවිදිව බුදුරදුන්ගේ අගසව් දෙනම බවට පත්වූහ. සඟසසුනේ සමාරම්භක අවධියට අදාළ වන මෙම සිදුවීම් කිහිපය පිළිබඳ පමණක් අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ මුල් කාලයේදී තරුණයන්ගේ විශේෂ නැඹුරුවක් බුදුසසුන වෙත පැවැති බවයි. මේ අතර සිටි බොහෝ දෙනා රහත් බවට පැමිණීමෙන්ද බුදුසසුනේ භාරධුර තනතුරුවලට පත්වීමෙන්ද හෙළිවන්නේ තරුණ පිරිසක් වුවත් ඔවුන් තුළ පැවැති අවබෝධයයි. ආරම්භයේදීද සඳහන් කළ පරිදි බුද්ධදේශනාවේදී තරුණ හෝ වෙනත් වයස් පරාසයක් විශේෂයෙන් ඉලක්ක කරගත් අවස්ථාවක් හමුනොවුවද ඇතැම් තරුණයන්ගේ මානසික තත්ත්වය හා වයස පිළිබඳ සැලකිලිමත් වී ඔවුන්ගේ ධර්මාවබෝධය පහසු කිරීම සඳහා බුදුරදුන් විසින්ම ගත් ඇතැම් ක්‍රියාමාර්ග පිළිබඳ කථා,ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වේ. එවැනි අවස්ථා අතරින් චුල්ලපන්ථක හිමියන්ට හා නන්ද තෙරුන්ට ලද අත්දැකීම් වැදගත් අවස්ථා දෙකකි. කටපාඩම් කිරීමේ සිය අදක්‍ෂතාව හේතුවෙන් උපන් තැවීම හාසිය වැඩිමහලු සොහොවුරු මහාපන්ථක තෙරුන්ගේ බලපෑම මත උපැවිදි වීමට තීරණය කර විහාරස්ථානයෙන් බැහැරවීමට ගිය චුල්ලපන්ථක තෙරුන්ගේ ගමන වළක්වා සුදු රෙදිකඩක් උන්වහන්සේගේ අතට දී එයින් සිරුර පිරිමැද කායගතාසති භාවනාවට සිත යොමු කරවීමෙන් පැය කිහිපයක් තුළ රහත් තත්ත්වය දක්වා යොමුකරවන ලදි. සුන්දරී සමග ඊළඟ දිනයේදී විවාහයට පත්වන්නට සිටි නන්ද කුමරු පැවිදි කර සුන්දරී පිළිබඳ නන්ද තෙරුන්ගේ ආශාව උපක්‍රමශීලීව දුරුකර රාගය වෙනුවට විරාගයට සිත යොමු කිරීමෙන් අනතුරුව රහත් වීමට අවැසි මානසික පසුබිම නිර්මාණය කරන ලදි. බුදුරදුන් තරුණ භික්‍ෂූන් ධර්මාවබෝධය වෙත යොමු කිරීමට ගත් උක්ත ක්‍රියාමාර්ග දෙක

සුවිශේෂී වන්නේ එමගින් තරුණයන්ටම යථා තත්ත්වය අවබෝධ කරගැනීමට ඉඩ සලසා තිබෙන බැවිනි.

මීට අමතරව මජ්ඣිමනිකායේ මජ්ඣිමපණ්ණාසකයේ රට්ඨපාල සූත්‍රය මෙහිලා වැදගත් කරුණු ඇතුළත් සූත්‍රයකි. එම සූත්‍රයේ සඳහන් වන තොරතුරුවලට අනුව රට්ඨපාල යනු ථුල්ලකොට්ඨිත නම් ගමේ ගම්පතියාගේ පුත්‍රයාය. ථුල්ලකොට්ඨිතයට වැඩමකළ බුදුරදුන්ගෙන් දහම් අසා පැවිදි වීමට අදහස් කළ රට්ඨපාල කුලපුත්‍රයා බුදුරදුන් හමුවී සිය පැවිදි වීමේ අදහස පවසයි.එවිට දෙමව්පියන්ගේ අවසරය ලැබ පැමිණෙන ලෙස බුදුරදුන් කළ දැනුම්දීම අනුව නිවසට ගිය රට්ඨපාල තමන් බුදුරදුන් දෙසූ දහම් දන්නා බවත් සක් සුදක් සේ ඒකාන්තයෙන් පිරිසිදු බ්‍රහ්මචරියාවේ හැසිරීම ගිහිගෙයි සිට සිදුකිරීම අපහසු හෙයින් බුදුරදුන් සමීපයේ පැවිදි උපසම්පදාව ලැබීමට කැමති බව දෙමව්පියන් හමුවේ පවසයි. (අම්ම තාත, යථාහං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි, නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, ඉච්ඡාමහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසයානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතුං අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජාය.) එහෙත් රට්ඨපාලගේ ඉල්ලීමට දෙමව්පියන්ගේ කැමැත්ත නොලැබුණි. දෙමව්පියන් මෙසේ පැවසීය. 'ඔබ අපට ප්‍රිය මනාප, සැප සේ පෝෂණය කළ එකම පුතාය. ඔබ කිසි දුකක් නොදනී. එහෙයින් කමින්, බොමින් ගිහි ගෙදරට සිත් අලවා වාසය කරන්න. කාම පරිභෝග කරමින් පින් කරමින් ගිහි ගෙයි වසන්න. ගිහි ගෙයින් නික්මී පැවිදි වන්නට අපි ඔබට අවසර නොදෙමු.' යනුවෙනි. අවසානයේදී පැවිදි වීමට අවසර ඉල්ලා රට්ඨපාල කුලපුත්‍රයා උපවාසයක් කරයි. දෙමව්පියන් විසින්ද දෙමව්පියන්ගේ දැනුවත් කිරීම මත පැමිණි රට්ඨපාලගේ යහළුවන් විසින්ද සිය අදහස අත්හරින ලෙසට කළ ඉල්ලීම බැහැර කළ රට්ඨපාල අවසානයේ කෙසේ හෝ සිය අරමුණ ජයග්‍රහණය කරගනී. බුද්ධ කාලයේ සිටි උසස්, ධනවත්, ප්‍රභූ පවුලකට අයත් තරුණයෙකු පැවිදි වීම වෙනුවෙන් සිදු කළ මෙම නොපසුබස්නා ව්‍යායාමය ප්‍රස්තුතයෙහිලා සැලකිය යුතු

කරුණකි. පැවිදි වී ටික දිනක් ගිය පසු එහි ඇති දුෂ්කරතාව අත්විඳින රට්ඨපාල තරුණයා වැඩිකල් නොගොස් උපැවිදි වී නැවතත් රජ ගෙදරට එනු ඇතැයි සිතා රට්ඨපාලගේ යහළුවන්ගේ අදහස මත ඔහුගේ දෙමව්පියන් ඔහුට පැවිදි වීමට අවසර දුන් නමුත් රට්ඨපාල තෙරුන් එසේ නැවතත් ගිහි ගෙදරට ඇළුම් නොකළේය. මෙම සූත්‍රයේ තරුණයන්ගේ පැවිද්ද සම්බන්ධයෙන් ඉතා වැදගත් තත්කාලීන සමාජ තොරතුරක්ද රට්ඨපාල තෙරුන් හා කෝරව්‍ය රජු අතර ඇති වන සංවාදයේදී අනාවරණය වේ. මිගාචීර නමැති උද්‍යානයේදී රට්ඨපාල තෙරුන් හමුවන කෝරව්‍ය රජු විමසන්නේ ජරාවෙන් පිරිහීම, ව්‍යාධියෙන් පිරිහීම, භෝගයෙන් පිරිහීම, ඥාතීන්ගෙන් පිරිහීම යන සතර ආකාරයෙන් පරිහානියට පත් වූ මෙලොව ඇතැම් කෙනෙක් කෙස් රවුළු බා කහවත් හැඳ ගිහිගෙයින් නික්ම සසුන්ගත වන නමුත් ඒ සිව් ආකාරයේ කිසිදු පරිහානියක් නොමැතිව කුමක් හේතුවෙන් ඔබපැවිදි වූයේද යනුවෙනි. මෙයින් පැහැදිලි වන්නේ ජරා, ව්‍යාධි, ඥාති, භෝග යන සිව් ආකාරයේ පරිහානිය නොමැති තරුණයෙකුගේ පැවිද්ද පුදුමයට කරුණක් වූ බවයි.

ලංකා ශාසන ඉතිහාසයේ ආරම්භයේ පටන්ම එනම්, අරිට්ඨ කුමරුගේ පැවිද්දේ පටන්ම තරුණයා හා තරුණ භික්ෂූන් වහන්සේ වැදගත් කාර්යාවලියක් ඉටු කර ඇත. ඒ අතර මෑතකාලීන ශාසන ඉතිහාසයේ වැදගත් චරිතයක් වශයෙන් සරණංකර සංඝරාජයන් වහන්සේ සඳහන් කළ හැකිය. බුද්ධ ධර්මය හා ඒ සමග බැඳුණු ශාසනික සම්ප්‍රදායයන් අතුරුදහන් වී උපසම්පදා භික්ෂූන්ගෙන්ද හිස්වූ මෙරට බුදුසසුන පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලියට මූලිකත්වය ලබාදුන්නේ සරණංකර නමැති තරුණ භික්ෂූන් වහන්සේය. මේ අනුව බුදුසසුනේත් විශේෂයෙන්ම ලංකා ශාසන ඉතිහාසයේත් තරුණ භික්ෂූන් වහන්සේ බැහැර නොකළ හැකි සාධකයකි.

## වර්තමාන ශ්‍රී ලංකා සමාජයේ තරුණ භික්ෂු වර්ගීකරණය

සමාජයේ සෙසු සංස්ථාවලට සාපේක්ෂව කාලානුරූපව භික්ෂු සංස්ථාවේද සිදුවන වෙනස්වීම් හා ඒ මත ගොඩනැගෙන

පුද්ගල චර්යා පිළිබඳ සමාජ ආකල්පයේ විවිධතා වැනි කරුණු පදනම් කරගෙන වර්තමාන ශ්‍රීලංකා සමාජයේ තරුණ භික්ෂුව සෙස්සන්ගේ අවධානයට පාත්‍ර වන චරිතයක් බවට පත්ව ඇත. මෙසේ අවධානය දිනාගැනීමට බලපෑ ප්‍රධාන කාරණාව වශයෙන් සැලකිය හැක්කේ භික්ෂුවගේ භූමිකාව පුළුල් වීමයි.එය දීර්ඝකාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මුල් කාලයේදී ආධ්‍යාත්මික සුවයම අරමුණු කරගෙන භික්ෂුත්වයට පත්වුවද පසුකාලීනව ශාස්ත්‍රීය කටයුතුවල ප්‍රධානත්වයද භික්ෂුව වෙතම පැවරිණි. මේ හේතුවෙන් විදර්ශනාධුර හා ග්‍රන්ථධුර යනුවෙන් ප්‍රධාන සම්ප්‍රදායයන් දෙකක් භික්ෂු සංස්ථාව තුළ පැනනැගුණි. සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ බොහෝ කෘති ප්‍රමාණයක කර්තෘත්වය භික්ෂූන් වහන්සේ වෙත පැවරී ඇති බව පැහැදිලි කරුණකි. ඒ අනුව විදර්ශනා වැඩීම හා දායක පක්ෂයේ ආධ්‍යාත්මික සුවය සඳහා අවවාද අනුශාසනා කිරීම යන ධර්මමය කාරණාවලට අමතරව පොතපත රචනා කිරීම, ඉගැන්වීම, අවවාද අනුශාසනා කිරීම වැනි ශාස්ත්‍රීය කටයුතුවල වගකීමද භික්ෂූන් වෙත පැවරුණි. භික්ෂූන්ගෙන් 'ධර්මශාස්ත්‍රීය' යන දෙවැදෑරුම් සේවාවක් ජනයා අපේක්ෂා කරන තත්ත්වය නිර්මාණය විය.මුල් අවධියේ පැවැති ඒකායන මාර්ගය පසුව ග්‍රන්ථධුර හා විදර්ශනාධුර වශයෙන් දෙපරිදි වීම ආරම්භ වීමත් සමග කල් යත්ම භික්ෂු සංස්ථාවේ විවිධ වර්ගීකරණ නිර්මාණය වන පසුබිම උදාවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද වන විට ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාව විවිධ නිර්ණායක යටතේ පුළුල් වී ඇත; වර්ගීකරණය වී ඇත. තවත් අයුරකින් කිවහොත් අද වන විට ශ්‍රී ලාංකේය බෞද්ධ භික්ෂූන් වහන්සේගේ භූමිකාව ඉතා පුළුල් පරාසයක විහිදී ගොස් ඇත. මේ සැම පරාසයකම තරුණ භික්ෂූන් වහන්සේද අඩු - වැඩි වශයෙන්නියෝජනය වෙයි. මේ කරුණ සැලකිල්ලට ගෙන තරුණ භික්ෂූන් වහන්සේගේ සමාජ හැසිරීම, නියෝජනය කරන සමාජ වපසරිය වැනි කරුණු පිළිබඳවද සලකා ශීර්ෂ කිහිපයකට වර්ග කළ හැකිය.

1. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලබන තරුණ භික්ෂූන් වහන්සේලා
2. විශ්වවිද්‍යාලයවල ඉගැන්වීම් කටයුතු සිදුකරන තරුණ භික්ෂූන් වහන්සේලා

3. පරිවේණස්ථානවල ඉගැන්වීම් කරටයුතු සිදුකරන තරුණ භික්ෂූන් වහන්සේලා
4. අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රයේ හෝ රාජ්‍ය අංශයේ වෙනත් තනතුරු දරන තරුණ භික්ෂූන් වහන්සේලා
5. තරුණ විහාරාධිපතීන් වහන්සේලා
6. ආගමික කටයුතුවලට මූලිකත්වය දෙමින් විහාරස්ථානයේ වැඩසිටින තරුණ භික්ෂූන් වහන්සේලා
7. ජනමාධ්‍යවල පෙනී සිටිමින් ආගමික කටයුතුවලට මූලිකත්වය දී කටයුතු කරන තරුණ භික්ෂූන් වහන්සේලා
8. අරණ්‍යවාසී තරුණ භික්ෂූන් වහන්සේලා
9. විදේශීය ධර්ම ප්‍රචාරන කටයුතුවල යෙදී සිටින තරුණ භික්ෂූන් වහන්සේලා
10. සමාජ සේවා කටයුතුවලට මූලිකත්වය දෙමින් කටයුතු කරන තරුණ භික්ෂූන් වහන්සේලා
11. ජාතික, ආගමික, සාමාජික විවිධ සංවිධාන පිහිටුවාගෙන ඒවායේ නිලතල දරමින් කටයුතු කරන තරුණ භික්ෂූන් වහන්සේලා යනුවෙනි.

මීට අමතරව පැවිද්ද අනුවද තරුණ භික්ෂූන් වහන්සේලා කොටස් දෙකකට වර්ග කළ හැකිය.


01. කුඩා කාලයේදී පැවිදි වී තරුණ වයසට පත්වූ තරුණ භික්ෂූන් වහන්සේලා
02. තරුණ වයසේදී පැවිදි වූ භික්ෂූන් වහන්සේලා යනුවෙනි.

**තරුණ භික්ෂූන් වහන්සේ පිළිබඳ වර්තමාන සමාජයේ ආකල්පය**

බොහෝ කාලයක සිට ශාසනික කටයුතුවලදී මෙන්ම සමාජ කටයුතුවලදීද භික්ෂූන් වහන්සේගේ නායකත්වය සමාජය විසින් අපේක්ෂා කරන තත්ත්වයට පත්ව ඇත. එහෙයින් තරුණ භික්ෂූන් වහන්සේ පිළිබඳව ඇති සමාජ ආකල්පය

හඳුනාගැනීම ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම බහු ආගමික, බහුවාර්ගික, බහුජාතික රටක් වශයෙන් ලෝකය හමුවේ පෙනී සිටීමට ශ්‍රී ලංකාව උත්සාහදරන මේ අවධියේදී තරුණ භික්‍ෂුව පිළිබඳ සමාජ ආකල්පය හඳුනාගැනීම ඉතා වැදගත් වේ.

කිසියම් සමාජයක ජීවත් වන පිරිසක් එම සමාජයේම ජීවත් වන තවත් පිරිසක් පිළිබඳදක්වන ආකල්පය එක සමාන තලයක නොපවතී හෙවත් එම ආකල්පවල විවිධතා පැවතිය හැකිය. ඊට හේතුව දැනුම් මට්ටම, අවබෝධය හා අද්දැකීම් ආදියෙහි මිනිසුන් අතර පවතින විෂමතාවයි. සමාජයේ යථා ස්වභාවයද එයයි. තමා රුචි කරන, තම මනසට ගැළපෙන පිරිස පිළිබඳ යහපත් ආකල්පයකට එළඹීමත් එසේ නොමැති පිරිස පිළිබඳ මධ්‍යස්ථ හෝ අයහපත් ආකල්පයකට එළඹීමත් සාමාන්‍ය සමාජ ස්වභාවයයි. මේ අතර තරුණ භික්‍ෂූන් වහන්සේ පිළිබඳව සමාජ ආකල්පය කෙබඳුදැයි සොයාබැලීම වැදගත් වන්නේ භික්‍ෂුව සමාජයේ ගරු කටයුතු, පූජනීය චරිතයක් වශයෙන් පිළිග ැනෙන හෙයිනි.ඒ අනුව සමාජයේ පවතින විවිධ ස්ථර අතර භික්‍ෂුව නියෝජනය කරන්නේ පූජනීය ස්ථරයයි. තරුණ භික්‍ෂුවක් පමණක් නොව කුඩා සාමණේරයන් වහන්සේ නමක් ඉදිරියේ වුවද වැඩිමහල්ලන් පවා හිස නමන්නේ එහෙයිනි. ගිහි සමාජයේ තරුණ පිරිස පිළිබඳව දක්වන ආකර්ෂණීය ආකල්පය ඊටත් වඩා දිනාගැනීමට තරුණ භික්‍ෂූන් වහන්සේට අවස්ථාව ඇත.එයට හේතුව පූජනීය චරිතයක් වශයෙන් හා සමාජයේ නායකයෙකු වශයෙන් තරුණ භික්‍ෂූන් වහන්සේට ඇති ආකර්ෂණයයි. එය සාමාන්‍ය ගිහි තරුණයෙකුට අහිමි, තරුණ භික්‍ෂූන් වහන්සේට පමණක් හිමිශක්තියකි. එහෙත් වර්තමාන සමාජයේ පැවැත්ම කෙරෙහි විමසිලිමත් වීමේදී තරුණ භික්‍ෂූන් වහන්සේ පිළිබඳ ස්වභාවයෙන්ම පවතින, පෙර කී ආකල්පයේ අඩු වැඩිවීම්, උස් පහත්කම්, විවිධ විචල්‍යතාවන් ඇතිවිය හැකිය. මෙම තත්ත්වය ගිහි - පැවිදි දෙපක්‍ෂයේම දෘෂ්ටිය හා හැසිරීම් රටා අනුව තීරණය වේ. වර්තමානයේ ගිහි සමාජය විසින් තරුණ භික්‍ෂූන් වහන්සේලා කෙරෙහි දක්වන ආකල්පයේ විවිධතාව පහත දැක්වෙන පරිදි පැහැදිලි කළ හැකිය.




ශ්‍රී ලාංකේය සමාජයේ ගිහි - පැවිදි දෙපක්ෂයම ඉහත වෙන් වෙන් වශයෙන් දැක්වූ හේතු එකකින් හෝ කිහිපයකින් සමන්විත වේ. මේ පිළිබඳ විමසීමේදී ඉතා පැහැදිලිව පෙනී යන්නේ භික්ෂූන් වහන්සේ පිළිබඳ සමාජ ආකල්පයේ විවිධතාවයි. මේ අදහස තරමක් දුරට හෝ පැහැදිලි කරන්නේ නම්, යම් පමණක ආගමික අවබෝධයක් ඇති ගිහියෙකු තරුණ භික්ෂූන් වහන්සේගෙන් බලාපොරොත්තු වන්නේ සිල්වත්, ගුණවත් පැවැත්මයි. ඒ ඔහුගේ ආකල්පයයි. ඒ අනුව ඔහුට වඩාත් ප්‍රිය වන්නේ සිල්වත්, ගුණවත් තරුණ භික්ෂූන් වහන්සේය. සමාජ සම්බන්ධතාවලට මූලිකත්වය දෙන පුද්ගලයෙක් තරුණ භික්ෂූන් වහන්සේගේ සිල්වත්කම, ගුණවත්කම පිළිබඳ එතරම් තැකීමක් නොකරනු ඇත. එයට හේතුව, ඔහුගේ ආකල්පය ප්‍රධාන වශයෙන් රැඳී පවතින්නේ තරුණ භික්ෂූන් වහන්සේ වටා බැඳී තිබෙන විවිධ සමාජ සම්බන්ධතා මතයි. මිනිසුන්ගේ රුචි - අරුචිකම් විවිධය. ඒ අනුව ඇතැම් ගිහියෝ තරුණ භික්ෂූන් වහන්සේගේ ජනප්‍රියත්වයට, දේශනා විලාසයට, කටහඬට, බාහිර පෙනුමට, සිව්රට, වටාපතට, පෞරුෂයට රුචි කරති.එහෙත් මේ සම්බන්ධයෙන් නොපමාවම පැහැදිලි කළ යුතු කරුණක් තිබේ. භික්ෂූන් වහන්සේ අතීතයේ පටන්ම බෞද්ධ සමාජයේප්‍රසිද්ධ වී තිබෙන්නේ සිල්වතුන් වහන්සේලා වශයෙනි. අවබෝධයෙන් සීලය පුරන අයකු තුළ ගුණවත්කමද නිසගින්ම වැඩේ. එසේ නම් තරුණ භික්ෂුවගේද කේන්ද්‍රීය ලක්ෂ්‍යය, අනන්‍යතාව සීලයයි. වර්තමානයේ ඇතැම් භික්ෂූන්

වහන්සේලා තම තරුණකම පිළිබඳ සලකා සීලය, සංවරකම වැනි භික්ෂු ජීවිතයේ අනන්‍යතාවන් ලඝු කොට සැලකුවද එය බුද්ධ දේශනාවට කිසි සේත් එකඟ අදහසක් නොවේ. එයට හේතුව සීලය යනු වෙනත් කිසිවෙකු විසින් බලයෙන් තමන් වෙත පැටවූ යමක් නොව සිය අවබෝධයෙන් හා කැමැත්තෙන් සමාදන් වී ආරක්ෂා කළ යුත්තකි. අකැමැත්තෙන්, වධයක් හෝ කරදරයක් ලෙස සලකා සමාදන් වන හෝ ආරක්ෂා කරන සීලයක් බුදුදහමේ උගන්වන්නේ නැත.එක් අවස්ථාවක භික්ෂූන් අමතන බුදුරජාණන් වහන්සේ පිණ්ඩාහාරයෙන් යැපීම පිළිබඳව කර ඇති පැහැදිලි කිරීම මෙහිලා ඉතා යෝග්‍ය වේ. එහිදී උන්වහන්සේ දේශනා කරන්නේ පිණ්ඩාහාරයෙන් යැපීම යනු මෙලොව ඇති ජීවිකාවන් අතරින් අන්තිමට ගැනෙන්නක්, ශාපයට ලක්වූවක් වුවත් භික්ෂූන් විසින් කිසියම් සුවිශේෂී හේතුවක් මත පිණ්ඩාහාරයෙන් යැපෙන බවයි. එය රජුන් විසින් සිය ධනය පවරාගත් හෙයින් හෝ භයෙන් පෙළීම හේතුවෙන් හෝ ජීවිකාවට අන් මගක් නොමැති හෙයින් හෝ සොරුන් විසින් ධනය පැහැරගත් හෙයින් හෝ ණයෙන් පෙළීම හේතුවෙන් හෝ නොවන අතර ජාත්‍යාදි දුකෙන් මිදීමේ අදහස, අවබෝධය ඇති අයෙකු වශයෙන් බවයි.3 අග්ගික්ඛන්ධොපම සූත්‍රයේසඳහන් වන්නේ තමන්ට සිව්පසය පිරිනමන පිරිසට පිනක් සිදුවීමටත් තමන්ගේ පැවිද්ද වඳ නොවීමටත් සඵල වීමටත් භික්ෂුව සිල්වත් වියයුතු බවයි.බුදුරජාණන් වහන්සේගේ එම දේශනාවෙන් පැහැදිලි වන්නේ සීලයෙන් ආත්මාර්ථයත් පරාර්ථයත් සාධනය වන බවයි.4 කාලානුරූපව සමාජයේ සිදුවන වෙනස්වීම් කෙරෙහි සංවේදී වීමක් වශයෙන් තරුණ භික්ෂුව සමාජසේවා කටයුතු, අධ්‍යාපනය, ප්‍රභූන් - ධනවතුන් - බලවතුන් ආශ්‍රය කිරීම වැනි දේ මගින් ප්‍රසිද්ධියක් ලැබුවද ඒ සියල්ලට පළමුව සිල්වතෙකු වීම අත්‍යවශ්‍ය කාරණාවකි.එමගින් ලැබෙනකායික, වාචසික හා මානසික සංවරකම සෙසු කටයුතු යහපත්ව සිදුකරගෙන යාමට අවශ්‍ය අවබෝධය ලබාදෙයි.

සාමාන්‍ය ජනතාවගේ නොදැනුවත්කමට මුවාවී, එය තමන්ගේ වාසි ප්‍රයෝජන සඳහා මාවතක් කර ගැනීම තරුණ භික්ෂුවකට තරම් නොවේ. මේ වන විට ඇතැම් තරුණ

භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛතාව ලබාදෙන්නේ ජනප්‍රියත්වයටයි. ඒ සඳහා විවිධ දේ කරති. ඇතමෙක් වෙනත් කිසිවෙකුගේ කටහඬ අනුකරණය කරති; මිනිසුන් හඬවති; හිනස්සති; නැති සීලයක් ගුණයක් පෙන්වති;බාහිර පෙනුමට මූලිකත්වය දෙති; විටෙක ආක්‍රමණශීලී වෙති; තවත් සමහරු තමන් අහිංසක, අනතිමානී අයෙකැයි ප්‍රදර්ශනය කර අන්‍යයන්ගේ සිත දිනාග ැනීමට වෙර දරති; නොයෙක් නොයෙක් ආකාරයේ විචිත්‍රවත් සිවුරු පොරොවති; ප්‍රභූන්, දේශපාලනඥයන්, බලවතුන්, ධනවතුන් ආශ්‍රය කරමින් ගිහි ජනතාව අතර තමන් පිළිබඳ නුසුදුසුභක්තියක්, ගෞරවයක් ඇතිකරවති; මෙකී නොකී තවත් බොහෝ දේ කරති. මෙකල ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා මෙවැනි බාහිර සාධක හරහා සිය චරිතය මතු කර පෙන්වීමට වෙර දැරුවද උන්වහන්සේලාගේ ශාස්තෘන් වහන්සේ කොසොල් රජුට පැහැදිලි කර දුන්නේ ඊට හාත්පසින්ම වෙනස් ධර්මයකි. ඒ පිළිබඳ සංයුත්තනිකායේ කෝසලසංයුත්තයේ අපුත්තකවග්ගයේ සත්තජටිල සූත්‍රයේදී මෙසේ සඳහන් වේ. බුදුරදුන් සැවතෙහි පූර්වාරාමයේ වැඩවෙසෙන අවස්ථාවක උන්වහන්සේ වෙත එළඹී කොසොල් රජු පිළිසඳර කථා කරමින් සිටින විට ඊට නුදුරින් ජටිලයන් සත්දෙනෙකුද නිගණ්ඨයන් සත්දෙනෙකුද අචේලකයන් සත්දෙනෙකුද ඒකසාටක බමුණන් සත්දෙනෙකුද පරිබ්‍රාජකයන් සත්දෙනෙකුද ගමන් කරනු දුටු කොසොල් රජු බුදුරදුන් සමග කරමින් සිටි පිළිසඳර කථාව නවතා වහා ඔවුන් වෙතට ගොස් උතුරු සළුව ඒකාංස කර දකුණු දනහිස බිම තබා වැන්දේය. නැවතත් බුදුන් වෙත පැමිණි රජු පැවසුවේ මේ ලෝකයේ රහත් හෝ රහත් මගට පිළිපන් යම් පිරිසක් වේ නම් මීට ටික වේලාවකට පෙර මෙතැනින් ගමන් කළ පිරිසද ඒ අතරින් එක් පිරිසක් බවයි.එවිට බුදුරදුන් කොසොල් රජුට පවසන්නේ ගිහි වූ, කම්සැප භුක්ති විඳින, දරුවන්ගෙන් පළිබෝධ ඇති යහන්හි වෙසෙන, සිනිඳු සඳුන් ගල්වන, මල්ගඳවිලවුන් දරන, රන් රිදී දරන ඔබ වැන්නන්ට අසවලා රහතෙකි කියා හෝ රහත් මගට පිළිපන් අයෙකි කියා හෝ නොදත හැකි බවයි.ඉන් අනතුරුව බුදුරදුන් පවසන්නේ දීර්ඝකාලයක් මනා සිහි කල්පනාවෙන් හාප්‍රඥාවෙන් යුතුවයමෙක් සමග වාසය කිරීමෙන් ඔහුගේ සීලය කෙබඳුදැයි

දතහැකි බවත් එපරිද්දෙන්ම මැනවින් කථා කිරීමෙන් පිරිසිදුකම පිළිබඳ දත හැකි බවත් එපරිද්දෙන්ම ආපදාවකදී යමෙකුගේ බුද්ධිය පිළිබඳ දත හැකි බවත් එපරිද්දෙන්ම සාකච්ඡා කිරීමෙන් යමෙකුගේ ප්‍රඥාව දත හැකි බවත්ය.ඉන් අනතුරුව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරන්නේ වර්ණයෙන් හා රූපයෙන් මිනිසුන් හඳුනාගත නොහැකි වන අතර දුටු පමණින් විශ්වාස නොකළ යුතු බවයි. ඊට හේතුව, මැනවින් දමනය වූවන්ගේ ස්වභාවයෙන් අසංවර වූවන් මේ ලෝකයේ හැසිරීමයි.[5] ඇතුළත අපිරිසිදු වූ බාහිරෙන් ශෝභමාන වූ ඇතමෙක් රන් මෙන් වූ මැටිමුවා කුණ්ඩලාභරණයක් සෙයින්ද රනින් වැසුණු ලෝහමය අඩමස්සක් සෙයින්ද පිරිවර ජනයාගෙන් වැසී හැසිරෙයි.[6]

බුදුරදුන් කොසොල් රජුට දෙසූ මේ දහම් කරුණු කිහිපය මෙම ප්‍රස්තුතයෙහිලා ඉතා වැදගත් වේ. අද වැඩසිටින ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා සිය තරුණකම, වර්ණය, රූපය, කටහඬ ආදිය ඉස්මතු කරමින් සාමාන්‍ය ජනතාවගේ ජනප්‍රියත්වය, ප්‍රසාදය අපේක්ෂා කරමින් හැසිරෙන ආකාරයක් පෙන්නුම් කරති. ඒ සඳහා ඉතා දැමුණු පුද්ගලයන්ගේ හැසිරීම, කථාබහ, ඉරියව් ආදිය තමන් වෙත ආරෝපණය කර ගැනීමට අමතරව චීවරය, පාත්‍රය, මුඬු හිස ආදියද සිත්සේ යොදාගනිති. බුදුවදනින්ම පැහැදිලි කරතහොත් එය ඇතුළත අපිරිසිදු, පිටින් පමණක් බබළන ශෝභමාන වස්තුවක් මෙන් පරිවාර සම්පත්තිය හේතුවෙන් තම දුර්වලතා සඟවාගෙන වාසය කිරීමකි.

මේ ආකාරයට ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා සිය හැකියාවන් හා ආකර්ෂණය වැනි දේ භාවිත කරමින් සිය ප්‍රතිරූපය ගොඩනගාගැනීමේ අරමුණ ඇතිව සිදුකරන ආගමික ස්වරූපයක් ගන්නා කටයුතුවලින් සිදුවන්නේ ගිහි ජනතාව තවදුරටත් නොමග යැවීමකි. ලාභ ඉපයීමත්, කීර්තිය, ප්‍රශංසාව, ජනප්‍රියත්වය ආදිය ගොඩනගාගැනීමත් භික්ෂූන්ගේ ගමන්මග නොවන බව වදාළ බුදුරජාණන් වහන්සේ එවැනි දේ කෙරෙහි ලොල් නොවන්නැයි භික්ෂූන්ට අවවාද කළහ.[7] එක් අවස්ථාවක බුදුරදුන් භික්ෂූන්ට පැහැදිලි කරන්නේ ලාභ සත්කාර යනු දරුණු, අන්තරායකර වූවක් බවයි.[8] මේ අනුව තරුණ භික්ෂූන් වහන්සේද

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වශයෙන් අන් සියල්ලටම වඩා සිල්වත්කම - ගුණවත්කම පුරුදු පුහුණු කළ යුතුය. එවිට සමාජය හමුවේ ජනප්‍රිය චරිතයක් වශයෙන් පෙනී සිටීමේ ඕලාරික ආශාව බැහැර කිරීමට අවැසි මානසිකත්වය නිර්මාණය වනු ඇත. එය පෞද්ගලිකව තමන්ට යහපතකි. පොදුවේ සමාජයටද යහපතකි.

මේ හැරුණු විට තරුණ භික්ෂූන් වහන්සේ පිළිබඳ වර්තමාන සමාජයේ යම් යම් අංශවල පවතින තවත් ආකල්ප කිහිපයක් හඳුනාගත හැකිය. ඒ අතර තරුණ භික්ෂූන් වහන්සේ කලහකාරී පිරිසක් වශයෙන්ද අන්තවාදීන් පිරිසක් වශයෙන්ද විවිධ දේශපාලන පක්ෂවල හෝ වෙනත් සංවිධානවල අතවැසියන් පිරිසක් වශයෙන්ද කුශලතා හීන පිරිසක් වශයෙන්ද එක් සීමිත වපසරියකට පමණක් සීමා වූ පිරිසක් වශයෙන්ද ගිහි සමාජයට සාපේක්ෂව අධික සැපසම්පත් භුක්ති විඳින පිරිසක් වශයෙන්ද ගිහි ජනතාව විසින් සිතන තත්ත්වයට පත්ව ඇතැයි සිතිය හැකිය.පොදුවේ ගත් කල, ගිහි ජනතාවගේ මෙකී සැම උපකල්පනයකටම බලපා තිබෙන්නේ පිටස්තර කණ්ඩායමක බලපෑම, ක්‍රියාකාරකම්, කූට උපක්‍රම හෝ වෙනත් එවැනි තත්ත්වයක් නොව තරුණ භික්ෂූන් වහන්සේගේ හැසිරීම් රටාවයි, ක්‍රියාකලාපයයි.

මෑතකාලීනව ශ්‍රී ලංකා සමාජයේ බිහි වූ ඇතැම් බෞද්ධ සංවිධානවල මූලික අරමුණ වූයේ ගිහි තරුණයන්ගේ හා තරුණ භික්ෂූන් වහන්සේගේ සිත දිනාගැනීමයි. ඇතැම් විටෙක එවැනිසංවිධානවලට නායකත්වය දෙන්නේද එක්කෝ තරුණ භික්ෂුවකි, නැතිනම් ගිහි තරුණයෙකි. එවැනි පිරිස් එකතු වී නගන හඬෙහි බොහෝ සත්‍ය, සාධනීය කරුණු ඇතුළත් යැයි සිතිය හැකි වුවද එම අදහස් ක්‍රියාත්මක කිරීමේදී හා ඊට එරෙහිව ගනුලබන ක්‍රියාමාර්ගවලදී ලෝකයට පෙනීයන්නේ තරුණ භික්ෂූන් වහන්සේ ඉතා කලහකාරී, කලහප්‍රිය, නො ඉවසන සුළු පිරිසක් වශයෙනි. පිටතට පෙනෙන ආකාරයට මෙම සංවිධානවල පරම අපේක්ෂාව බුදුදහම, බෞද්ධ ජනතාව හා බෞද්ධ උරුමයන් ආරක්ෂා කිරීමයි; ඒවාට ඇති අභියෝග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි; පාලක පක්ෂයට යම් පණිවුඩයක්

ලබාදීමයි. ඇතැම් විට එම සංවිධානවල අවංක අපේක්ෂාවද එය විය හැකිය. එම සංවිධානවල නායකකාරකාදීන් මාධ්‍යය හමුවේ හෝ මහජනයා දැනුම්වත් කිරීමට පවත්වන පෙලපාලි, රැස්වීම් වැනි අවස්ථාවලදී හෝ අදහස් දක්වන ආකාරයද ඇතැම් විට මෙවැනි ආකල්පයක් ජනතාව තුළ ඇති වීමට හේතු වන්නට ඇත. තරුණ භික්ෂූන් සහභාගි වන මෙවැනි අවස්ථාවලදී පොලිසිය හා අනෙකුත් ආරක්ෂක අංශවල සාමාජිකයන් සමග විවිධාකාරයේ ගැටුම් ඇතිකර ගැනීම, වාදවිවාදවල පැටලීම මේ වන විට ඉතා සාමාන්‍ය සිදුවීමක් බවට පත්ව ඇත. එවැනි අවස්ථාවල බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා හැසිරෙන ආකාරය මෑත කාලයේඅවස්ථා ගණනාවකදීම මාධ්‍ය හරහා ප්‍රචාරය කෙරුණි. එපමණක් නොව, මෙවැනි රූපරාමු ලෝකයට නිරාවරණය වීමත් සමග ලෝකවාසීන් මෙරට තරුණ භික්ෂූන් පිළිබඳ ඇතිකරගන්නා අදහස කිසිසේත් ශුභවාදී නොවන බව විශේෂයෙන් පැහැදිලි කළ යුතු නොවේ. බුදුදහමේ ආරක්ෂාව උදෙසා හඬනැගීමේ පරම පවිත්‍ර, ඒකායන චේතනාව උන්වහන්සේලා තුළ පැවතිය හැකි වුවත් එවැනි හැසිරීම්වලින්ද සිදුවන්නේ බුදුදහමේ ආරක්ෂාවට ප්‍රබල තර්ජනයකි; විශාල අභියෝගයකි. බාල වූද, තරුණ වූද, මහලු වූද ඕනෑම තලයක සිටින භික්ෂුව තුළ පැවතිය යුතු ඉවසීම, කරුණාව, මෛත්‍රිය, දූරදර්ශී නුවණ වැනි ජීව සාධක එවැනි හැසිරීම්වලින් කිසිවිටෙක ප්‍රකට නොවේ. බෞද්ධ සමාජයට හානි කිරීමට ප්‍රසිද්ධියේ හා අප්‍රසිද්ධියේ ක්‍රියාත්මක වන විවිධ සංවිධානවලට තරුණ භික්ෂූන්ගේ මෙවැනි හැසිරීම් රටා අගනා සාධකයෝය. එහෙයින් තරුණ භික්ෂූන් වහන්සේ එවැනි අංශ පිළිබඳවද සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ. තරුණ භික්ෂූන් වහන්සේගේ මෙපරිදි වූ හැසිරීම් රටාවේ අනෙක් විපාකය වන්නේ ඔවුන් අන්තවාදීන් පිරිසක් වශයෙන්සමාජ ආකල්පයක් නිර්මාණය වීමයි. මැද පෙරදිග කලාපයේ පවතින ඉස්ලාම් මූලධර්මවාදය ආගමික අන්තවාදයේ බිහිසුණු ප්‍රතිඵලයකි. ඒ පිළිබඳ මෙහිදී සඳහන් කළේ බෞද්ධ ව්‍යාපාර හෝ භික්ෂූන් වහන්සේ ඊට සමාන කිරීමේ අදහසකින් හෝ උත්සාහයකින් නොවේ.අවිහිංසාව, මෛත්‍රිය වැනි මූලධර්ම මත ගොඩනැගුණු සර්ව සත්ත්ව හිතවාදී ධර්මයක් වන බුදුදහම අන්තවාදී ප්‍රතිපත්තියක් යම් විටෙක

පිළිගෙන තිබේද? අනුමත කර තිබේද? යනු විමසා බැලිය යුතු කරුණකි. සද්ධම්මපතිරූපක සූත්‍රයේදී බුදුරදුන් දෙසුවේ බුදුදහම විනාශ කිරීමපඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූත රූපවලට කළ නොහැක්කක් බවයි. එය කළ හැක්කේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිසට පමණක් බව වදාළ උන්වහන්සේ එහිදී තවදුරටත් පැහැදිලි කරන්නේ ධර්මය සනාථ කිරීමේ, සුරක්‍ෂා කිරීමේ හැකියාව පවතින්නේද එකී සිව්වණක් පිරිසට බවයි. වසර ගණනාවක් පුරා ප්‍රවර්ධනය වීමෙන් සංකීර්ණ තත්ත්වයට පත් වූ, ඇතැම් බලකාමී දේශපාලනඥයන්ගේ තීන්දු තීරණ හේතුවෙන් ව්‍යාප්ත වූ තත්ත්වයන් එකවර හෝ සතියක්, මාසයක් වැනි කෙටි කාලයක් තුළ හෝ උද්ඝෝෂණ, ජනහමු ආදිය පැවැත්වීමෙන් හෝ සමනය කළ හැකිදැයි විමසිය යුතුය. නිශ්චිත වැඩපිළිවෙළකින් හා දූරදර්ශී අවංක නායකත්වයකින් හැර, මතු වී ඇති ප්‍රශ්නවලට විසඳුම් සෙවීම දුෂ්කරය. මෙම සිදුවීම්වල අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ සාමාන්‍ය ජනතාවගේ ආවේගශීලීත්වය මතු කිරීම හා තරුණ භික්ෂූන් පිළිබඳඅයහපත් සමාජ ආකල්පයක් ඇති කිරීම පමණි.

විවිධ දේශපාලන පක්‍ෂ අනුව බෙදී බුදුන් වහන්සේට හෝ උන්වහන්සේගේ ධර්මයට වඩා දේශපාලන නායකයන් හා ඔවුන්ගේ ප්‍රතිපත්ති, න්‍යායයන් ගුරු කොට සැලකීම වර්තමානයේ තරුණ භික්ෂූන් අතර පමණක් නොව සමස්ත භික්ෂු සංස්ථාවේම සාමාන්‍ය ලක්‍ෂණයක් බවට පත්ව ඇත. එහෙයින් මෙය තරුණ භික්ෂූන් කෙරෙහි පමණක් යම් දේශපාලනමය සමාජ ආකල්පයක් ඇතිකිරීමට හේතුවන බව හුවාදැක්වීම සාධාරණ නොවුවත් ප්‍රස්තුතය පිළිබඳ සලකා බලා තරුණ භික්ෂූන් පිළිබඳ පමණක් මෙහිදී සඳහන් කරනු ලැබේ. කවර මුහුණුවරකින් පෙනී සිටියද දේශපානලය යනු බලය මත පදනම් වූවකි. තමන් ලද බලය තහවුරු කර ගැනීමත් රැකගැනීමත් තමන් අතින් ගිලිහුණු බලය නැවත ලබාගැනීමත් අහිමි බලය ලබාගැනීමත් පක්‍ෂ දේශපාලනයේ මූලධර්ම වශයෙන් පෙනීසිටී. එය අවංකකම, මෛත්‍රිය, කරුණාව, පරාර්ථකාමය යහපත් ආකල්ප වෙනුවට කපටිකම, ඊර්ෂ්‍යාව, පළිග ැනීම, තරගය, ආත්මාර්ථකාමය වැනි දුර්ගුණවලට ආකරයකි. අද

වන විට මෙම තත්ත්වය මෙරට ගිහි පැවිදි සියලු දෙනාම අත්විඳින ධර්මතාවක් බවට පත්ව ඇත. දේශපාලනයේ යථාර්ථය මෙය වුවත් මෙකල ඇතැම් දේශපාලන පක්ෂවල පාගමනේ, රැළියේ පවා තරුණ භික්ෂූහු ගමන් කරති;වේදිකාවේ ඉදිරිපෙල අසුන් අරා වැඩහිඳිති; වාද විවාදවලට වැඩම කරති; සිය දේශපාලන නායකයන් හෝ ඔවුන්ගේ මතවාදය ජයග්‍රහණය කිරීමට ගිහියන් සමග වාද කරති; තර්ක කරති; ඇතැම් දේශපාලනඥයන්ගේ ඡන්ද ප්‍රචාරණ කටයුතු ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ මෙහෙයවති; දේශපාලනඥයන්ගේ උපදේශකවරුන්, සම්බන්ධීකරණ නිලධාරින් වශයෙන් කටයුතු කරති; ඇතැම්හු මැතිවරණවලටද ඉදිරිපත් වෙති. මෙය වහා පැහැදිලි කරගත යුතු තත්ත්වයකි. භික්ෂූන්ගේ මෙම දේශපාලන කටයුතු බුද්ධ දේශනාවට අනුකූලදැයි දැනුම් තේරුම් ඇති යම් ගිහියෙකු විසින් විමසුව හොත් භික්ෂූන්ට දේශපාලනය අකැප යැයි බුදුන් විසින් පැනවූ විනය ප්‍රඥප්තීන් නැතැයි පවසා එම ගිහියාගේ මතවාදය එක වැකියකින්ම බැහැර කරති. භික්ෂුවට දේශපාලනය අකැප යැයි සඳහන් වන විනය ප්‍රඥප්තියක් නොමැති වුවද මෙහිදී කල්පනා කළ යුත්තේ භික්ෂුවගේ ඒකායන අරමුණ හා ආධ්‍යාත්මික ජීවිතය සමග දේශපාලනය වැනි සපුරාම ලෞකික ක්ෂේත්‍රයක් කෙසේ ගැළපිය හැකිද යනුයි. අවම වශයෙන් සංස්ථාවක් ලෙස තමතමන් සතු වගකීම පිළිබඳවවත් සිතා හුදෙක්බලය මත පදනම් වූ මෙවැනි ව්‍යාපාරවලට දායක වීමේ හෝ ඒ වෙනුවෙන් මැදිහත් වීමෙන් සිදුවන අගතිය තේරුම් ගැනීම වටී.

තරුණ භික්ෂූන් වහන්සේලා කුසලතා හීන පිරිසක් වශයෙන් සමාජයේ ඇතැමුන්ගේ ආකල්පයක් පවතී.පරිගණක සාක්ෂරතාව, තාක්ෂණික ඥානය, ඉංග්‍රීසි දැනුම වැනි අංශවලින් තරුණ භික්ෂූන් වහන්සේ නමක් යම් කාර්යයක් සිදුකළ හොත් ඇතැමුන් පුදුමයට පත්වන්නේ එහෙයිනි. බොහෝ විට පැවිදි සමාජයට ඇතුළු වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල සාමාන්‍ය ජනතාවගේ දරුවන්ය. එම ප්‍රදේශවල ශක්තිමත් අධ්‍යාපන පසුබිමක් නොමැත. නගරයේ මෙන් පහසුකම් නොමැත. භික්ෂු අධ්‍යාපනයේ (පිරිවෙන් අධ්‍යාපනයේ)වැඩි අගයක් ලබාදෙන්නේ ප්‍රාචීන විෂයවලටයි. ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි, තාක්ෂණවේදය වැනි විෂයයන් පිළිබඳ

පිරිවෙන් අධ්‍යාපනය තුළප්‍රාචීන විෂයවලට සමාන වටිනාකමක් ලබානොදෙයි.එහෙයින් පාසලෙන් ලද මුල් අධ්‍යාපනයෙන් හා අනතුරුව ලද පිරිවෙන් අධ්‍යාපනයෙන් ඉංග්‍රීසි වැනි නූතන භාෂා ශාස්ත්‍ර හා ගණිතය, විද්‍යාව, තාක්‍ෂණවේදය වැනි විෂයක්ෂේත්‍ර පිළිබඳ පරිචයක් ලබාගැනීමට අවකාශයක් නොලැබේ. සංකීර්ණ සමාජයක සක්‍රිය සංස්ථාවක් වශයෙන් භික්ෂූන් වහන්සේ කෙරෙහි ඇති වන මෙම ආකල්පය එතරම් යහපත් වූවක් නොවේ. එමගින් භික්ෂූන් වහන්සේලා කිසියම් නිශ්චිත විෂයක්ෂේත්‍රයකට ලඝු වීම නොවැළැක්විය හැකිය. ක්‍රමයෙන් දැනුමෙන් හා කුශලතාවන්ගෙන් සන්නද්ධ වන ගිහි තරුණ පරපුර සමග මුහු වීමට, ඔවුන් සමග මැනවින් ගනුදෙනු කිරීමට සමත් වන, ඒ සඳහා අවැසි ආත්ම විශ්වාසය ඇති තරුණ භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම යුගයේ අවශ්‍යතාවයි. එසේ නොවුවහොත් සිදුවන්නේ මේ වන විට යම් පමණකට ලඝු වී ඇති තරුණ භික්ෂුවගේ චරිතය තවදුරටත් ලඝු වීමයි, සමාජය තුළ අක්‍රිය චරිතයක් වීමයි.

## වර්තමාන තරුණ භික්ෂු සමාජයේ අවනතීන් හා ඒවාට හේතු

කාලානුරූපව සිදුවන උන්නතීන් මෙන්ම අවනතීන්ද ඕනෑම සමාජයක පවතින පොදු ලක්‍ෂණයකි.මෙහිදී තරුණ භික්ෂූන් වහන්සේලා අතර පවතින අවනතීන් පිළිබඳ හා එවැනි තත්ත්වයක් ඇති වීමට බලපෑ හේතු සාධක පිළිබඳ අවධානය යොමු කිරීමෙන් බලාපොරොත්තු වන්නේ හුදු විවේචනයක් සිදුකිරීමට නොවේ. එවැනි තත්ත්වයන් හඳුනාගැනීමත් ඒවා විධිමත් සාකච්ඡාවකට ලක්කිරීමත් තරුණ භික්ෂු සංස්ථාවේ උන්නතියටත් ප්‍රගමනයටත් හේතු වේ. වර්තමාන තරුණ භික්ෂු සමාජයේ පවතින අවනතීන් කිහිපයක් හඳුනාගත හැකිය. ඒවා පහත පරිදි දක්වනු ලැබේ.

1. බුද්ධධර්මය පිළිබඳ අනවබෝධය හා ධර්ම ඥානයේ හීනතාව
2. නව දැනුම උත්පාදනය කරගැනීමකින් තොරව ශ්‍රැතියට මූලිකත්වය දීම
3. ශාසනික සම්ප්‍රදායේ හර පද්ධතීන් හඳුනානොගැනීම

4. තුනුරුවන් පිළිබඳ ශ්‍රද්ධාවක් නොමැති වීම
5. පවට බිය නොවීම
6. තමන් විසින් දේශනා කර කරුණු සිය චරිතයෙන් ප්‍රකට නොවීම
7. නූතන හා පුරාතන භාෂාඥානයේ හීනතාව හා අධ්‍යාපනයට මූලිකත්වය නොදීම
8. සමාජ සම්බන්ධතා කළමනාකරණය නොකරගැනීම
9. පැවිදි ජීවිතයේ මූලික අරමුණුවලින් බැහැර වීම හා ලෞකික අරමුණුවලට මූලිකත්වය දීම
10. ස්වාධීනව කටයුතු කිරීමට පෙලඹීම
11. රටේ සිවිල් නීතිය පිළිබඳ නොතැකීම
12. නූතන සන්නිවේදනය හා තාක්‍ෂණය පිළිබඳ වැරදි භාවිතයන්
13. තමන් පිළිබඳ අධිතක්සේරුවක් ඇති කරගැනීම
14. භික්‍ෂූන් නමකට අවශ්‍ය සංවරකම පිළිබඳ නොතැකීම

මෙරට තරුණ භික්‍ෂු සමාජයේ දක්නට ලැබෙනඋක්ත අවනතීන් පොදුවේ හඳුනාගත හැකි ඒවාය. නො එසේ නම්, සැම තරුණ භික්‍ෂූන් වහන්සේ නමක් තුළම පෙර කී ලක්‍ෂණ සියල්ල පවතී යැයි අදහසක් මින් කිසි විටෙකත් නොපැවසේ. මෙකී අවනතීන් ඇතැම් තරුණ භික්‍ෂූන් වහන්සේලා කෙරෙන් පමණක් ප්‍රකට වන තත්ත්වයන්ය. කෙසේ වෙතත් ගිහි සමාජයට සාපේක්‍ෂව පූජනීය, වන්දනීය සංස්ථාවක් වශයෙන් සංඝ සමාජය යහපත්ව, අර්බුද අවම කරගෙන පවත්වාගෙන යාමටත් සංඝ සමාජයේ වර්තමාන හා අනාගත පැවැත්ම විධිමත් කර ගැනීමටත් මෙරට බුදුසසුනේ පැවැත්ම සනාථ කරගැනීමටත් තරුණ භික්‍ෂූන් වහන්සේ තුළගුණාත්මක බව ආරක්‍ෂා කර ගැනීම ඉතා වැදගත් වේ. මෙරට සංඝ සමාජය ක්‍රමයෙන් ඉතා සීමිත ප්‍රමාණයකට ලඝු වී ඇති පසුබිමක ඒ තුළ තරුණ භික්‍ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය ඉතාම සීමිත වේ. කෙසේ වෙතත් ප්‍රමාණාත්මකව

වන සීමා වීම්වලට සාපේක්‍ෂව ගුණාත්මක වශයෙන්ද නොපිරිහී සමස්ත ශ්‍රී ලාංකේය සංඝ සංස්ථාවේත් විශේෂයෙන්ම තරුණ භික්‍ෂූන් වහන්සේගේත් ගුණාත්මක පක්‍ෂය පෝෂණය කිරීමට හැකි වුවහොත් එය මෙරට බුදුසසුනේ වැදගත් ඉදිරි පියවරකි, ගුණාත්මක ප්‍රවණතාවකි. ඉහත සඳහන් කළ අවනතිකාරකයන් සියල්ල එකින් එක විග්‍රහ කිරීම අත්‍යවශ්‍ය වුවත් මේ එයට අවස්ථාව නොවේ. එහෙයින් ඒ අතර කාරණා කිහිපයක් පිළිබඳ පමණක් මෙහිදී විග්‍රහ කරනු ලැබේ.

බුද්ධධර්මය පිළිබඳ අනවබෝධය හා ධර්මඥානයේ අඩුලුහුඬුකම් වර්තමාන තරුණ භික්‍ෂු සංස්ථාවේ ප්‍රධානතම පරිහානිය වශයෙන් සැලකිය හැකිය. සෙසු සියලු අවනතීන්ට මෙය මූලබීජ සැපයීම ඊට හේතුවයි. මේ හේතුවෙන් පෞද්ගලිකව තමන්ටත් පොදුවේ සමාජයටත් යන දෙපක්‍ෂයටම අහිතකර, අවාසිදායක තත්ත්වයන් නිර්මාණය වීම වැළැක්විය නොහැකිය. තරුණ වයසෙහි පසුවන්නෙකු වශයෙන්ද සාමූහික සමාජයක ජීවත් වන්නෙකු වශයෙන්ද තමන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවන විවිධ මානසික තත්ත්වයන්, සිත් වේදනාවන්, අමිහිරි චේතනාවන් හෝ වෙනත් එවැනි දුෂ්කරතාවන් නිසි පරිදි කළමනාකරණය කරගැනීමට නොහැකි වී මහත් ව්‍යාකූලතාවන්ට පත්වීම පෞද්ගලිකව තමන්ට අත්වන අවාසියයි.යමෙකුට ධර්මය පිළිබඳ යම් දැනුමක්, අවබෝධයක් තිබේ නම් එය ජීවත්වීම පහසු කරයි. එසේ නොමැති නම් තරුණ භික්‍ෂූන් වහන්සේද සාමාන්‍ය ගිහි ජීවිතයේ තරුණයන්ගේ ඕලාරික හැසිරීම් මට්ටමට පත්වේ. සිය මූලික අරමුණ අමතක වේ; තමන් නියෝජනය කරන සංස්ථාව අමතක වේ. ක්ලේශ ධර්ම පාලනයට හෝ යටපත් කරගැනීමට අවැසි මානසික ශක්තිය හීන වේ. අවසානයේදී හුදු ශ්‍රමණවේශධාරියෙකුගේ තත්ත්වයට පත්වේ. පොදුවේ සමාජයට මෙයින් සිදුවන අයහපත පිළිබඳවද සිතිය යුතුය. බාල, තරුණ, මහලු භේදයකින් තොරව මෙරට භික්‍ෂූන් වහන්සේ සමාජයට නායකත්වය දෙති. යම් පමණකින් හෝ ධර්මය පිළිබඳ අවබෝධයක් නොමැත්තෙකු විසින් ලබාදෙන සමාජ නායකත්වය පමණක් නොව, විශේෂයෙන් ආගමික නායකත්වය විශ්වාසනීය

වූවක් නොවේ. එවැනි නායකත්වයකින් ජනතාවට සාර්ථකත්වයක්, යහපතක් නොලැබේ. එහෙයින් ඔවුහු අයාලේ යති. ඊට හේතුව ඔවුන්ට නායකත්වය ලබාදෙන තරුණ භික්ෂූන් වහන්සේගේ අනවබෝධයයි. නිරන්තරයෙන් තමන් හට සිව්පසයෙන් උපස්ථාන කරන ගිහි ජනතාවට ධර්ම දානයෙන්, ධර්මික අවවාද අනුශාසනාවලින් ප්‍රත්‍යුපකාර කරන්නැයි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට උවදෙස් දුන්හ.9 එහෙත් ගිහි ජනතාවට සාපේක්ෂව ධර්මය පිළිබඳ යම් අවබෝධයක් හා එමගින් ලද මානසික සුවයක් නොමැති භික්ෂුව, මෙම ප්‍රස්තුතයට අනුව නම් තරුණ භික්ෂූන් වහන්සේ, ධර්මදානයෙන් කෙසේ ප්‍රත්‍යුපකාර කරයිද යනු ප්‍රශ්නයකි. ධර්මය පිළිබඳ අවබෝධය සඳහා දහමට සමීප විය යුතුය; ධර්මය චරිතායනය කරගත යුතුය; දහමට නැඹුරු විය යුතුය. ඒ සඳහා දහම පිළිබඳ දැනුමක් ලබාගැනීමද අත්‍යවශ්‍යය. දැනුම ලබාගැනීමේ සාධනීය ප්‍රවේශය කියවීමයි. ධර්මය පිළිබඳ පොතපත කියවන තරුණ භික්ෂූන් වහන්සේගේ දහම් දැනුම වර්ධනය වේ. තරුණ භික්ෂූන් වහන්සේගේ දහම් දැනුම වර්ධනය වීම ගිහි බෞද්ධයන්ගේද යහපතට හේතු වේ. ඊට හේතුව, කියවා බලා නිවැරදි කරගත්, සංවර්ධනය කරගත්දැනුමකින් තරුණ භික්ෂූන් වහන්සේ ගිහි ජනතාවට දහම් දෙසීමයි. මෙකල බොහෝ තරුණ භික්ෂූන් වහන්සේ පොතපත කියවීමට රුචි නොකරති; විශේෂයෙන්ම දහම් පොතපත කියවීමට රුචි නොකරති. කවරෙකුගේ හෝ පැහැදිලි කිරීමක්, දේශනාවක් අසා හෙවත් ශ්‍රැතියට මූලිකත්වය දී ලද අවසරයෙන් තමන් වහන්සේද එසේම වදාරති. ඒ අතර බොහොමයක් කරුණු බුදුදහමට පටහැනිය. ඇතැම් කරුණු හිතලු කථාය. අගක් මුලක් නැත. පදනමක්ද නැත. මේ බව පැහැදිලි කිරීමට ප්‍රමාණවත් නිදසුනක් ඇත. එනම්, මෙරට බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා දන්පිළේදී ගිහි ජනතාවට ආශීර්වාද කරන්නේ 'ඉච්ඡිතං පච්චිතං...' කියාය. ධර්මාසනයට වැඩමකරන බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා නොයෙකුත් හාස්‍යෝත්පාදක කථා කියමින් ධර්මශ්‍රාවකයන් හිනස්සති. හස්ත විකාර, මුඛ විකාර, ආදිය කරමින්, ඉඟිබිඟි පාමින් හඬ විකෘති කරමින් විවිධ අනුකරණවල නිරත වෙති. ඇතැම්හු ශ්‍රාවකයන් හඬවති. නළුවන් පිරිසක් මෙන් ක්‍රියා කරති. තමන්ට රිසි සේ

ධර්මය විග්‍රහ කරති. 'කාලීන බණ' යැයි වර්ගයක් දෙසති. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා සිය ධර්ම දේශනය පුරාම ගිහියන්ට බණිති; දොස් කියති; නිර්දය ලෙස විවේචනය කරති. මේ සියලු තත්ත්වයන්ට හේතුව භික්ෂූන් වහන්සේ දහමෙන් ඈත් වීමයි; ධර්මය පිළිබඳ යම් පමණක හෝ අවබෝධයක් නොමැතිකමයි; ධර්මඥානයේ හීනතාවයි.

තුනුරුවන් කෙරෙහි සැදැහැති, පවට බිය වූ තරුණ භික්ෂූන් වහන්සේ තමන්ද රැකේ. සසුනද රකිති. එසේ නොවූ විට තමන්ද වැනසී සසුනද වනසති. 'සැදැහැවත් පින්වතුනි' යනුවෙන් භික්ෂූන් වහන්සේ විසින් ගිහි බෞද්ධයන් අමතන නමුත් සැදැහැවත් විය යුත්තේ ගිහි බෞද්ධයන් පමණක් නොවේ. ශ්‍රද්ධාව යනු භික්ෂූන් වහන්සේ තුළද පැවතිය යුතු අනිවාර්ය චෛතසිකයකි. භික්ෂූන් වහන්සේ තුනුරුවන් පිළිබඳ විශ්වාස ඇත්තෙකු විය යුතුය. අනෙක් අතට, පාපය යනු ගිහි - පැවිදි දෙපක්ෂයටම අදාළ වූවකි. ගිහියෙකු වුවත් පැවිද්දෙකු වුවත් පාපියා පාපියාමය. විශේෂයෙන්ම මෙහිදී, තරුණ අදහස් ඉස්මතු වන, ගතින්ද සිතින්ද තරුණකම රැඳී තිබෙන තරුණ භික්ෂූන් වහන්සේ සැදැහැතියෙකු, පවට බිය අයෙකු වෙයි නම් එය උන්වහන්සේගේ ශාසනික ප්‍රතිපදාවට මහත් ආශීර්වාදයකි, රැකුලකි, ආත්ම විශ්වාසයට කාරණයකි, සිතට එකඟව ජීවත් වීමට හේතුවකි. තරුණ භික්ෂූන් වහන්සේ තුළ නොයෙක් විපරීතයන් ගොඩනැගීමට සැලකිය යුතු හේතුවක් වී ඇත්තේ තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් තොර වීම හා පවට බිය නොවීමයි.

නූතන හා පුරාතන භාෂාඥානයේ හීනතාවත් ශාස්ත්‍රීය කටයුතු කෙරෙහි මන්දෝත්සාහි වීමත් මෙකල තරුණ භික්ෂු සමාජයේ අවනතියට බලපෑ තවත් අංශයකි. මීට පෙරද සඳහන් කළ පරිදි ශ්‍රී ලාංකේය සමාජය විසින් භික්ෂූන් වහන්සේගෙන් ධර්මමය සේවාවකට අමතරව ශාස්ත්‍රීය සේවාවද විශේෂයෙන් බලාපොරොත්තු විය. ඒ අනුව 'ධර්ම - ශාස්ත්‍රීය' යන දෙවැදෑරුම් සේවාව ඒකාබද්ධ කළ කේන්ද්‍රීය චරිතය භික්ෂූන් වහන්සේය. මෙරට සාහිත්‍ය රචනාවලිය මීට ප්‍රමාණවත් සාක්ෂ්‍ය සපයයි. මේ කාලය වන විට භික්ෂූන් වහන්සේ වෙතින් 'ශාස්ත්‍රීය බලය' යම් පමණක් ගිලිහී

ඇතැයි පැවසීමේ වරදක් නැත. විශේෂයෙන්ම පාලි, සංස්කෘත යන පුරාතන සම්භාව්‍ය භාෂා හා තත් සාහිත්‍ය අධ්‍යයනයෙන් තරුණ භික්ෂූන් වහන්සේ බොහෝ සෙයින් ඉවත් වී ඇත. ඇතැම් විශ්වවිද්‍යාලයවල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින්ම පාලි, සංස්කෘත භාෂා හඳුන්වන්නේ 'මළභාෂා' යනුවෙනි. ඒ අතර බොහෝ දෙනෙක් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පාලි හෝ සංස්කෘත හෝ, එසේත් නැත්නම් ඒ විෂයයන් දෙකටම හෝ පෙනී සිට ඒ හේතුවෙන්ම විශේෂ ප්‍රවේශ යටතේ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනයට වරම් ලැබූ අයයි. ඇතැමෙක් පාලි, සංස්කෘත වැනි විෂයයක් හදාරන බව පැවසීමටත් අකමැති වන්නේ එය තමන්ට අවමානයක් හෝ ලජ්ජාවට කාරණයක් ලෙස හෝ සිතන හෙයින් විය හැකිය. මේ හේතුවෙන් සිදුවන්නේ තරුණ භික්ෂූන් වහන්සේ වෙතින් සාම්ප්‍රදායික භාෂා කුශලතාව, දැනුම දුරස්වීම පමණක් නොවේ. බුද්ධ දේශනාවේ මාධ්‍යය වන පාලි භාෂාව ත්‍රිපිටක ධර්මයට පිවිසීමට, එය හැදෑරීමට තිබෙන හොඳම ප්‍රවේශයයි. ඒ පිළිබඳ අවබෝධයක්, දැනුමක් නොමැති බුදුදහම හැදෑරීමේ උවමනාව තිබෙන බොහෝ දෙනෙක් සිය නොහැකියාව පිළිබඳ කණස්සල්ලට පත් වෙති. සංස්කෘත උගෙනීමෙන් අනුපමේය දැනුම් සම්භාරයකට රැගෙන යයි. පෙර සිටි සැම වියත් භික්ෂූන් වහන්සේ නමක්ම ස්වකීය දැනුම ප්‍රකට කළේ පාලි, සංස්කෘත භාෂා - සාහිත්‍යයේ ආභාසයෙන්මය. වැදගත් කරුණ නම්, මේ භාෂා - සාහිත්‍ය නොහදාළ තරුණ භික්ෂූන් වහන්සේ හට සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ප්‍රාමාණික, ගැඹුරු දැනුමක් ලබාගැනීමට නොහැකි වීමයි. සිංහල භාෂාවත් සාහිත්‍යයත් පෝෂණය වී තිබෙන්නේ පාලි, සංස්කෘත භාෂා සාහිත්‍යවලිනි. මේවායෙන් ඈත්වීමේ දුර්විපාකවලට තරුණ භික්ෂූන් වහන්සේ අද වන විට අත්විඳිති. උන්වහන්සේලා අතර අතිබහුතරයකට නිවැරදි අක්ෂර වින්‍යාසය යොදා සිංහල වචනයක් ලියාගත නොහැකිය. බොහෝ වචන උච්චාරණය කරන්නේ සාවද්‍ය ලෙයසි. මහාප්‍රාණ නමැති අක්ෂර වර්ගයක් භාෂාවේ තිබෙන බවත් ඒවා උච්චාරණයේදී විශේෂත්වයක් තිබෙන බවත් උන්වහන්සේලා බහුතරයක් නොදනිති. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා මූර්ධජ 'ෂ' අකුර කුමක්දැයි නොහඳුනති. ඇතැම්

ගිහියන් මෙන් උන්වහන්සේලාද එය හඳුන්වන්නේ 'ප' යනු සයන්න යනුවෙනි. තාලුජ 'ශ' යනු 'ග' යනු සයන්නයි. දන්තජ 'ස' යනු 'නිකන්' සයන්නයි. මෙවැනි වැරදීම් සුළුකොට තැකිය හැකිද යනු ප්‍රශ්නයකි. තරුණ භික්ෂූන් වහන්සේලාගේ පරිත්‍රාණ ධර්ම දේශනාවක් අසා සිටියහොත් උච්චාරණ දෝෂ එමටය. පද බෙදීම් ආදිය පිළිබඳ කිසිදු අවබෝධයක් නැත. සාවද්‍ය පාඨද අඩුවක් නැත. යම්කිසි පදයක අර්ථය යම් තරමකට හෝ පැහැදිලි කරගැනීමට උන්වහන්සේලා අපොහොසත් වෙති. මෙතෙක් පැහැදිලි කළේ පුරාතන භාෂා සාහිත්‍යය පිළිබඳ මෙකල තරුණ භික්ෂූන් වහන්සේලාගේ දැනුම අවම වීම පිළිබඳවයි. මෙතැන් සිට නූතන භාෂා පිළිබඳ දැනුම කෙබඳුදැයි විමසා බැලේ. පාලි, සංස්කෘත යන පුරාතන භාෂා අවඥාවෙන් බැහැර කරන බොහෝ තරුණ භික්ෂූන් වන්සේලාගේඉංග්‍රීසි වැනි නූතන භාෂා පිළිබඳ දැනුම ඊටත් අල්පය. ඇතැමෙකුට අනුව ඉංග්‍රීසි කථා කිරීම, ඉංග්‍රීසියෙන් ලිවීම වැනි දේ තමන්ට ස්පර්ශ කළ නොහැකි, අවිෂය තත්ත්වයන්ය. මේ හේතුවෙන් තරුණ භික්ෂූන් වහන්සේගේ සමාජමය උපයෝගිතාව, වටිනාකම හීන වේ. නව දැනුමක් වෙත ප්‍රවේශ වීමට තිබෙන අවස්ථාව අහිමි වේ. සමාජය තුළ අක්‍රිය චරිතයක් බවට පත්වේ. විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලැබුවද එහි නියම වටිනාකමක් නොලැබේ. මෙවැනි තත්ත්වයකදී උගතුන්ගේ සමාජයේදී අවඥාවට ලක්වීම නොවැළැක්විය හැකිය.

පරිවේණස්ථානවල (මූලික ශ්‍රේණි හැර) හා විශ්වවිද්‍යාලයවල උගෙනුම ලබන්නේ භික්ෂූන් අතර තරුණ භික්ෂූන් පිරිසයි. උගෙනීම යනු උන්වහන්සේලාගේ ප්‍රමුඛතම කාර්යයකි. එහෙත් වර්තමානයේ බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලාට එය ප්‍රමුඛ කාර්යයක් නොවේ. සාමාන්‍ය ගිහි සමාජයේ උගෙනුම ලබන ගිහි තරුණ තරුණියන් මෙන් මෙකල බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලාද උගෙනීම හැර වෙනත් කොතෙකුත් දේකරති. උන්වහන්සේලා බොහෝ පිරිසකට තමන් හදාළ හෝ හදාරන විෂයයේ ප්‍රාමාණික දැනුමක් නොමැත. දැන් දැන් ජාතික විශ්වවිද්‍යාලයවලට තෝරාග නු ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ කැපීපෙනෙන අඩුවක් දක්නට ලැබේ. ඊට ප්‍රධානතම හේතුව විභාග සමත් වන භික්ෂු

ප්‍රතිශතය අඩු අගයක් ගැනීමයි.විශ්වවිද්‍යාලය තුළදී බොහෝ ශිෂ්‍ය හිමිවරුන්ගේ ප්‍රතිඵල ලේඛන බරපතල ලෙස කඩාවැටී ඇත. අමතර කියවීමක් මගින් දැනුම උත්පාදනය කරගැනීමට හෝ වර්ධනය කරගැනීමට කල්පනා නොකිරීම බරපතල තත්ත්වයකි. සිංහල, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ දර්ශනය, ඉතිහාසය, පුරාවිද්‍යාව, දර්ශනය වැනි විෂයවල භික්ෂු අනන්‍යතාව ගිලිහී ගොසිනි. අද වන විට බොහෝ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අරමුණ බවට පත්ව ඇත්තේ කෙසේ හෝ උපාධිය සම්පූර්ණ කරගැනීමයි.

ජනප්‍රිය චරිතයක් බවට පත්වී යම්කිසි සමාජමය බලයක් ගොඩනගාගැනීම මෙකල ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ තවත් ලක්ෂණයකි. මේ හරහා ප්‍රභූන්, දේශපාලනඥයන්, බලවතුන්, ධනවතුන් ආදීන්ට සමීප වීමත් කීර්ති ප්‍රශංසා, ලාභ සත්කාර ආදිය ලබාගැනීමත් බලාපොරොත්තු වනවා විය හැකිය. එහෙත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ලාභසත්කාරවලට නොඇලීම භික්ෂුවගේ වැදගත් ලක්ෂණයක් බවයි. මෙකී ජනප්‍රිය චරිතය ගොඩනගාගැනීමට නොයෙකුත් විකල්ප තෝරාගනිති. ඒ අනුව ඇතැමෙක් 'දහම' යන නමින් විවිධ දේශනා පවත්වති; මාධ්‍යයට වැඩමකරති; නැති ගුණ - නැති සිල් පෙන්වති; වෛවර්ණ සිවුරු පොරවති; විවිධ සංවිධාන ආදිය පිහිටුවාගෙන සිය නම පතුරුවති; පොත්පත් ලියති; විවිධ පුදපූජා ක්‍රම, වන්දනා ක්‍රම හඳුන්වා දෙති. දසදහස් ගණන් ජනතාව රැස්කරවා ආගමික මුහුණුවරක් ආරෝපණය කර නොයෙකුත් හරසුන් ප්‍රදර්ශන, උත්සව ආදිය කරති; වෙනත් අය ලවා සිය ගුණ කියවති; ලියවති. නිසි අවබෝධයක් නොමැතිව, ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ ජනප්‍රිය වීමේ ආශාව සංසිඳුවාගැනීමට සිදුකරන පෙර කී ආකාරයේ කටයුතුවල අවසාන ප්‍රතිඵලය වන්නේ සාමාන්‍ය බෞද්ධ ජනතාව බොහෝ පිරිසක් නොමග යෑමයි, හරසුන් අදහස් හා කටයුතු ජනතාව අතර හරවත් අදහස් හා කටයුතු වශයෙන් පැතිරීමයි. නම් වශයෙන් සඳහන් නොකළද මීට සුදුසු උදාහරණ ගණනාවක් මෑතකාලයේ සිදුවුණි. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා ෆේස්බුක් වැනි සමාජ වෙබ් අඩවි හරහාද සිය ජනප්‍රියත්වය සාධනය කර ගැනීමේ දැවැන්ත වෑයමක යෙදෙති.

භික්ෂූන් වහන්සේ යනු මෙරට සමාජයේ කේන්ද්‍රීය චරිතයක් බව නැවත නැවත කිවයුතු නොවේ. එයට ප්‍රධානතම හේතුව උන්වහන්සේගේ පරපටිබද්ධ ජීවිතයයි. බුදුරදුන් භික්ෂූන්ට අනුශාසනා කළේ තමන් පරපටිබද්ධ ජීවිකාවක් ඇත්තෙකැයි නිතර සිහිකරන ලෙසයි. මෙවැනි පසුබිමක භික්ෂූන් වහන්සේ වටා සමාජ සම්බන්ධතා රාශියක් ගොනු වී ඇත.විශේෂයෙන්ම ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ මේ තත්ත්වය සුවිශේෂීතාවකි. ජනතාව අතර තරුණ භික්ෂූන් වහන්සේ කෙරෙහි වැඩි ආකර්ෂණයක් පවතී. එම ආකර්ෂණය තුළ ගෞරවයක්ද වන්දනීයත්වයක්ද මුසුව ඇත. එහෙත් සැම තරුණ භික්ෂූන් වහන්සේ නමක්ම තමන් වටා ගොනු වී ඇති සමාජ සම්බන්ධතා සිය ගරුත්වයද භික්ෂු ප්‍රතිරූපයද රැකෙන පරිදි කළමනාකරණය කරගැනීමට අදක්ෂ වීම ඛේදනීය තත්ත්වයකි. නොපැහැදුණවුන්ගේ පැහැදීමත් පැහැදුණවුන්ගේ වඩා පැහැදීමත් ඇතිකිරීමට සුදුසු පරිදි හැසිරීම භික්ෂු චර්යාවේ ලක්ෂණයයි. එහෙත් මෙකල ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ බාහිර හැසිරීම කෙරෙහි වහා පැහැදෙන ඇතැම් ගිහි පින්වතුන්ගේ එකී පැහැදීම දිගුකාලයක් පුරා නොපවතින්නේ තරුණ භික්ෂූන් වහන්සේගේ සැබෑ චරිතයේ පවතින දුර්වලතා කල් යත්ම ඉස්මතු වන බැවිනි. එය සමාජ සම්බන්ධතා නිසි පරිදි කළමනාකරණයෙහිලා තරුණ භික්ෂූන් වහන්සේලාගේ නොහැකියාවේ, අදක්ෂතාවේ ප්‍රතිඵලයකි. ඇතැම් විටෙක තමන් වන්දනීය, පූජනීය චරිතයක් බව අමතක කරන උන්වහන්සේලා සිය ගරුත්වය කෙලෙසා ගැනීමට සමාජ සම්බන්ධතා දායක කරගනිති. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේ නමක් කීර්තිය, ප්‍රශංසාව, නොයෙකුත් ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් ක්‍රියාකර අවසානයේදී තමන් කෙරෙහි පැහැදුණ පිරිස අහිතවතුන් බවට පත්කර ගනී. පන්සල සමග බැඳී සිටින තරුණ තරුණියන්ගේ පටන් දහම් පාසල, පෙර පාසල, සමිති සමාගම් ආදිය සමග සිය සම්බන්ධතාවන් නිසි පරිදි කළමනාකරණය නොකරගැනීම හේතුවෙන් නොයෙකුත් අපහසුතාවන්ට පත්වන තරුණ භික්ෂූන් වහන්සේලා පිළිබඳ පුවත් නිතර අසන්නට ලැබේ. මේ හැරුණු විට ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා ගිහි නිවෙස් සමග දැඩි ඇල්මෙන් කටයුතු කරති. විශේෂිත දායකකාරකාදීන් නිර්මාණය

කරගෙන ඒ ඒ කුලවලට ගිජුව වසති. ඒවායේ අවසාන ප්‍රතිඵලය සමාජ අපවාදයයි,අවමානයයි. තරුණ හෝ වෙනත් තරාතිරමක සිටින භික්ෂුවක් සමාජ සම්බන්ධතා ගොඩනගාගත යුතු වන්නේ 'තමන් භික්ෂුවකි' යන පදනමේ පිහිටා මිස වෙනත් යමක පිහිටා නොවන බව තේරුම් ගැනීම ගිහි - පැවිදි දෙපක්ෂයේම යහපතට හේතු වනු ඇත.

කුඩා අවධියේදී නිසි ගුරු ඇසුරක් යටතේ නොහික්මුණු භික්ෂුවගේ අරමුණු උන්වහන්සේ තරුණ වියට පත්වනවාත් සමග වෙනස් මගක් ගැනීමද තවත් අවනතියකි. යමෙකු පැවිදි වීමට පෙර සිටම ලබාදෙන පූර්ව අධ්‍යාපනයේ වැදගත්ම කොටසකි 'දසධම්ම සූත්‍රය'. පැවිද්දෙකු විසින් නිතර මෙනෙහි කළ යුතු කරුණු දහයක් මෙහිදී බුදුරදුන් විසින් වදාරා ඇත. භික්ෂූන් වහන්සේගේ ජීවිතාරම්මණ දහයක් මෙම සූත්‍රයේ අන්තර්ගත වේ. එය පරිපූර්ණ දේශානවකි. මෙවැනි උදාර ජීවන දර්ශනයක ආභාසය ඇතිව ගොඩනැගෙන භික්ෂුවගේ පරමාර්ථද උදාර විය යුතුය. වයසින් මුහුකුරා ගොස් තරුණ වයසට පත්වත්ම භික්ෂු ජීවිතයට සම්බන්ධ එවැනි මූලික සිද්ධාන්ත පිළිබඳ යම් ආකාරයකින් හෝ සිත මෙහෙයවිය හැකි නම් කෙතරම් අගනේද? කාලානුරූපව ගිහි සමාජයේද ඊට සාපේක්ෂව පැවිදි සමාජයේද සැලකිය යුතු මට්ටමේ යම් යම් අවනතීන් පවතින බව පිළිගත යුතුය. එහෙත් ගිහි තරුණයාගේ ජීවිත අරමුණු හා තරුණ භික්ෂුවගේ ජීවිත අරමුණු අතර සැලකිය යුතු වෙනස්කමක් නොමැති නම් මේ දෙපිරිස වෙනස් වන්නේ ඇඳුමෙන් පැළඳුමෙන් පමණක්ද යනු විමසිය යුතු ප්‍රශ්නයකි. සෙසු අයගෙන් කෙසේ වෙතත් සිය දෙමව්පියන්ගෙන් පවා වැඳුම් ලබන, අනුන්ගෙන් යැපෙන තරුණ භික්ෂූන් වහන්සේගේ අරමුණු එකී උදවියට වඩා අවම මට්ටමක හෝ ඊට සමාන මට්ටමක පවතී නම් පින් පව් විශ්වාස කරන පිරිසක් වශයෙන් එය සාංසාරික වශයෙන් තමන් වෙත ඇතිකරග න්නා වූ මහත් දෝෂයකි. මෙය වනාහි තමන් විසින්ම තමන් පිළිබඳ විමසිය යුතු තත්ත්වයකි.මෙකල ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා පැවිදි ජීවිතයේ මූලික අරමුණු යම් පමණකින් හෝ නොතකන අතර ලෞකික අරමුණු ජයග්‍රහණයෙහි උත්සුක

වෙති;ගිහි තරුණයන්ටත් වඩා ලෞකික, කාමභෝගී ජීවිත ගතකරති; එයම සැපයක් වශයෙන් දකිති; වර්ණනා කරති. තමන් විවර්ණභාවයට පත්වූවෙකැයි නිතර සිහිපත් කරන්නැයි බුදුරදුන් භික්ෂූන්ට උවදෙස් දුන්නේ පුහුදුන් සිතෙහි ස්වභාවයෙන්ම හටගත හැකි මෙවැනි ලෞකික අපේක්ෂාවන් සමනය කිරීම සඳහාය.

ස්වාධීනව කටයුතු කිරීමට පෙලඹීමත් තමන් පිළිබඳ අධිතක්සේරුවක් ඇතිකර ගැනීමත් මෙකල තරුණ භික්ෂු සංස්ථාවේ අපගමනයට බලපෑ තවත් කාරණා දෙකකි. මේ අතරින් මුලින් සඳහන් කළ 'ස්වාධීනව කටයුතු කිරීම' යනුවෙන් කුමක් අදහස් කරන්නේදැයි පැහැදිලි කරගත යුතුය. ගිහියෙකුට නියමිත ආගත පටිපාටියක් තිබෙන්නේ යම් සේද පැවිද්දෙකුටද එය එසේමය. සැම භික්ෂූන් වහන්සේ නමකටම අනිවාර්යයෙන්ම ආචාර්යයන් වහන්සේ නමක් සිටී. එසේම වැඩසිටීමට විහාරස්ථානයක්ද අනිවාර්යයෙන් ඇත. දායක - දායිකා පිරිසක් ඇත. සද්ධිවිහාරිකයන් පිරිසක්ද ඇත.කුඩා අවධියේ සිටි භික්ෂුවක් ක්‍රමයෙන් තරුණ වයසට පත්වන්නේ මේ සැමගේම දායකත්වයෙනි, මග පෙන්වීමෙනි, ආධාරයෙනි. එවැනි පසුබිමක තමන් පිළිබඳව පමණක් සිතන මතන ආකාරයේ ආත්මාර්ථකාමී ස්වාධීනත්වයකට ඇලුම් කිරීම විශේෂයෙන් තරුණ භික්ෂුවකගේ අවනතියට ප්‍රධානතම හේතුවකි. තරුණකම හේතුවෙන් තමන් තුළ ඇති වන විවිධ මානසික අභියෝගවලට ගොදුරු වීම හා ඒ හේතුවෙන් සිය ජීවිතය ව්‍යාකූල කර ගැනීම විටෙක සිදුවන්නේ ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ මෙකී අනවබෝධාත්මක ස්වාධීනතාව හේතුවෙනි. ක්‍රමයෙන් තරුණ වයසට පත්වන තරුණ භික්ෂූන් වහන්සේ හේතු ඇතිව හෝ නැතිව සිය ගුරු හිමියන්ගේත් දායක දායිකාවන්ගේත් දොස් දකිති; ඔවුන් සමග ගැටුම් ඇති කරගනිති. එය ස්වාධීන වීමේ මූලාරම්භයයි. අනතුරුව ආයතනික වශයෙන් පවතින සාමූහික වගකීම්වලින් බැහැර වෙති; සෙසු සියල්ලන්ම තමන්ගේ තරහකාරයන් ලෙස කල්පනා කිරීමට පෙලඹෙති. විශ්වවිද්‍යාලය වැනි උසස් අධ්‍යාපන ආයතනට ඇතුළු වන ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා අතරද මෙම තත්ත්වය පවතී. විශ්වවිද්‍යාලයේදී තමන් ලබන නිදහස හා

අද්දැකීම් හමුවේ කුල්මත් වන ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා ගුරු හිමියන්ද විහාරස්ථානයද දායක පින්වතුන්ද සිය නිදහසට බාධාවක් ලෙස සලකා සහේතුකව හෝ අහේතුකව ඒ අයගෙන් ක්‍රමයෙන් දුරස් වෙති. සාමූහික වගකීමකින් හෝ ආයතනික බැඳීමකින් තොරව ගොඩනැගෙන මෙකී තරුණ භික්ෂුව ඇතැම් විට උපැවිදි වේ. එසේ නොමැති නම් භික්ෂු සංස්ථාව පිළිබඳ කළකිරීමෙන්, පශ්චාත්තාපයෙන් යුතුව සසුනේ රැඳේ.

මේ අතර ඇතැම් තරුණ භික්ෂූහු තමන් පිළිබඳ අධිතක්සේරුවක් ඇතිකරගෙන පැවිදිකමේ මුල් සිඳගනිති. මෙවැනි තත්ත්වයකදී අත්තුක්කංසන, පරවම්භන යන කෙලෙස් දහම් දෙක වැඩෙන බව බුද්ධ දේශනාවයි. භික්ෂූන් වහන්සේගේ මූලික අවශ්‍යතාවන් වන සිව්පසය සම්පාදනය කර පූජා කරන්නේ ගිහි බෞද්ධ ජනතාව විසිනි. එවැනි තත්ත්වයක් යටතේ තමන් පිළිබඳ අධිතක්සේරුවක්, අධිමානයක් ඇතිකරගෙන ඒ හේතුවෙන් ගිහි ජනයා පෙළීම, පහත් කොට සැලකීම, ඔවුන් ඉදිරියේ ස්වකීය ගර්වය - ආඩම්බරය ප්‍රකට කිරීම කෙතෙක් දුරට තරුණ භික්ෂුවකට තබා භික්ෂුවකට ගැළපේදැයි සිතා බැලිය යුතුය. සිය උගත්කම, පරිවාර සම්පත්තිය වැනි දේ පිළිබඳ සිතා සෙස්සන් පිළිබඳ අවමානයෙන් සැලකීම පූජනීය චරිතයකට කිසිසේත් සුදුසු නොවේ. තරුණ භික්ෂූන් වහන්සේ අනතිමානී විය යුතුය; ආදරය, කරුණාව, මෛත්‍රිය වැනි මානව ගුණධර්මවලින් ඔපවත් විය යුතුය. අනවශ්‍ය ගර්වයක් ආරෝපණය කරගනිමින් ගිහි ජනතාව ඉදිරියේ කටයුතු කිරීමෙන් හා ඔවුන්ගේ ආගමික කටයුතු ආදිය සිදු කිරීමේදී කයෝර ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් තරුණ භික්ෂූන් වහන්සේ පිළිබඳ යහපත් සමාජ ආකල්පය බිඳවැටේ. අයහපත, අප්‍රසාදය මතුවේ. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා අන්‍යයන්ට, විශේෂයෙන්ම ගිහි ජනතාවට දොස් කීමෙහි සුවිශේෂී හපන්කමක් ප්‍රකට කරති. අන් අයගේ නොමනා ක්‍රියා හේතුවෙන් භික්ෂු සංස්ථාව කෙරෙහි ඇති වන අයහපත් සමාජ ආකල්පය විතැන් කිරීමට තරුණ භික්ෂූන් වහන්සේට කළ හැකි දේ බොහෝය. එය කළ හැක්කේ තමන් පිළිබඳ අධිතක්සේරුවකින් නොවේ. අනෙක් අතට ගිහි ජනයා ඉදිරියේ හීන, දීන චරිතයක් ලෙස හැසිරීමෙන්ද නොවේ.

රටේ සිවිල් නීතිය සැමට පොදුය. ගිහි - පැවිද යනුවෙන් විශේෂයක් කිරීම නීතියේ සමබරතාව ගිලිහී යාමකි.මෑතකාලීනව මෙරට ජනමාධ්‍යයෙන්ද ප්‍රචාරය වූ ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම ප්‍රකට කෙරෙන දර්ශන නරඹන විට හැඟී යන්නේ රටේ සිවිල් නීතිය පිළිබඳ උන්වහන්සේලාගේ නොදැනීම පිළිබඳවයි. එසේ නොමැති නම් ඒ පිළිබඳ කිසිම තැකීමක් නොකිරීමේ පුරුද්දයි. මෑතකාලීනව සිදුකළ විරෝධතා ව්‍යාපාරවල ප්‍රධාන භූමිකාවක්තරුණ භික්ෂුව නියෝජනය කළේය. එවැනි ඇතැම් අවස්ථා සංවිධානය කර තිබුණේ තරුණ භික්ෂූන් වහන්සේලා නායකත්වය දරන භික්ෂු සංවිධාන හෝ බෞද්ධ සංවිධාන මගිනි. ඒවායේදී තරුණ භික්ෂූණ් වහන්සේ ආරක්ෂක නිලධාරීන් සමග ගනුදෙනු කරන ආකාරයත් ගැටුම් ඇති කරගන්නා ආකාරයත් බොහෝ විට ගිහියන් එවැනි අවස්ථාවල හැසිරෙන ආකාරයටත් වඩා කලහකාරීය. මාර්ග බාධක පෙරළමින්, ගේට්ටුවලින් හෝ තාප්පවලින් පනිමින් නොසරුප් වදන් තෙපළමින් ආරක්ෂක අංශ සමග ගැටෙමින් මෙසේ අමුතුම හැසිරීමක යෙදෙන්නේ මෙරට සිවිල් නීතිය පිළිබඳ තරුණ භික්ෂූන් වහන්සේගේ නොදැනුවත්කම හේතුවෙන් විය හැකිය. එසේ නොමැති නම් චීවරය දැරීම හේතුවෙන් තමන් සිදුකරන සියලු කටයුතු සමාජය විසින් අනුමත කළ යුතු යැයි කල්පනා කර එසේ කරනවා විය හැකිය. තවද, ඇතැම් විට චීවරය යනු අනෛතික කටයුතු සිදුකිරීමේ බලපත්‍රය යැයි සිතනවා විය හැකිය. නීතිගරුක සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාවලියේ පුරෝගාමී චරිතය විය යුත්තේ භික්ෂූන් වහන්සේය. උන්වහන්සේ සිය පරමාදර්ශයෙන්ම නීතිගරුකභාවය සමාජයේ සෙසු ජනතාවට පෙන්විය යුතුය. මීට වසර කිහිපයකට පෙර මෙරට සිදුකෙරෙන ගව ඝාතනයට විරෝධය පෑමක් වශයෙන් මහනුවර දළදා මාළිගාව ඉදිරියේ සිය සිරුරට ගිනි තබාගත්තේ තරුණ භික්ෂූන් වහන්සේ නමකි. ඉන් අනතුරුව පැවැති විරෝධතා කිහිපයකදීද තරුණ භික්ෂූන් වහන්සේ කිහිප නමක්ම සිය සිරුරට ගිනි තබාගැනීමට වෑයම් කළහ. මෙවැනි හැසිරීම් ආගම-ධර්මයට ගැළපෙන්නේ කෙසේදැයි විමසීමට අමතරව රටේ නීතියට අනුකූල වන්නේ කෙසේදැයිද විමසීම වටී. චීවරය හේතුවෙන් තමන්ට හිමි වී ඇති සමාජ

ගරුත්වය අනෛතික ක්‍රියා සිදුකිරීමෙහිලා බලපත්‍රයක් නොකරග ැනීම වටී. 'බුද්ධ නීතියට' අනුගත වූ තරුණ භික්ෂුවට රටේ සිවිල් නීතියට අනුගත වීම යනු කිසි සේත් අපහසු කාර්යයක් නොවේ.

මෙකල තරුණ භික්ෂූන් වහන්සේලා අතර නූතන තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය ඉහළ මට්ටමක පවතී. සංස්ථාවක් වශයෙන් කාලානුරූපව වෙනස් වීම අවශ්‍යතාවකි. එහෙත් එය යහපත් වෙනස්වීමක් විය යුතුමය. සම්ප්‍රදායේ මුල් සිඳගනිමින් වෙනස් වීම අදාළ සංස්ථාවේ දීර්ඝ කාලීන නිරවුල් පැවැත්මට හානියකි. නූතන තාක්ෂණය හා සන්නිවේදන ක්‍රමශිල්ප භාවිතයෙහි ඇතැම් තරුණ භික්ෂූන් සතු දැනුම බෝහෝ විට ගිහි තරුණයන්ගේ ඒ පිළිබඳ දැනුම අභිභවයි. එය යහපත් ප්‍රවණතාවක්දැයි තීරණය කළ හැකි වන්නේ ඒවායේ භාවිතය පිළිබඳ විමසීමෙන් පමණි.එවැනි නව ප්‍රවණතාවන් විචාරශීලීව, ක්‍රමානුකූලව මෙන්ම ප්‍රයෝජනවත්ව භාවිත කිරීම මගින් තරුණ භික්ෂූන් වහන්සේ සෙසු තරුණ තරුණියන්ටද ආදර්ශ සම්පන්න වීම වැදගත් වේ. සිය දැනුම, ධර්ම කාරණා, බෞද්ධ සිතිවිලි, දාර්ශනික අදහස් ප්‍රචාරණය සඳහාද උද්දීපනය සඳහාද නූතන තාක්ෂණය ආශීර්වාදයක් කරගෙන ඇති හිමිවරු අල්ප වශයෙන් හෝ සිටිති. වැදගත් වන්නේ එය තවදුරටත් ප්‍රවර්ධනය කරගැනීමයි. මෙහිලා තරුණ භික්ෂූන් වහන්සේගේ භාවිතය, හැසිරීම ආදර්ශ සම්පන්න විය යුතුය, විචාරශීලී විය යුතුය. සරු දේ සරු ලෙස දැකීමත් නිසරු දේ නිසරු බව දැන බැහැර කිරීමත් සරු දේ සොයා යන්නාගේ අනිවාර්ය ලක්ෂණයකි.10 එසේ නොවේ නම් එය සමස්ත සංස්ථාවේම පරිහානියට තවත් එක් සාධකයකි. නූතන සන්නිවේදන ක්‍රම අතර ෆේස්බුක් නමැති සමාජ වෙබ් අඩවිය තරුණ භික්ෂූන්ගේ ආකර්ෂණය දිනාගෙන ඇත. සැබැවින්ම එහි නියම ඵල ලබාගත හැක්කේ තරුණ භික්ෂූන් වහන්සේ වැනි විචාරශීලී, විචක්ෂණශීලී අයට පමණි. එහෙත් මෙහිදී සැලකිය යුතු වන්නේ තරුණ භික්ෂූන් වහන්සේ එයින් නියම ඵල ලබාගනීද? උන්වහන්සේ ගිහි තරුණ තරුණියන්ට සාපේක්ෂව විධිමත්ව හා විචාරවත්ව මෙය භාවිත කරන්නේද? යන කරුණු පිළිබඳවයි. සැබැවින්ම ඒ පිළිබඳ ප්‍රශ්නාර්ථයක් මතු

වේ. බොහෝ තරුණ භික්ෂූන් වහන්සේ මෙවැනි සන්නිවේදන ක්‍රම භාවිත කරන්නේ දේශපාලනඥයන්, නළුනිළියන් මෙන් ස්වකීය ප්‍රතිරූපය ගොඩනගාගැනීම මූලික අරමුණ කරගෙනය. එයින් එහා ගිය දැක්මක් බොහෝ විට පෙනෙන්නට නොතිබේ. ඇතැම්හු තමන්ම ගත් ඡායාරූප පළ කරති; නැතිනම් නළුනිළියන් මෙන්, සාමාන්‍ය ගිහියන් මෙන් විවිධ විකාර ඉරියව් පෙන්නුම් කරමින් ගත් ඡායාරූප පළකරති. ධර්මාසනයේ වැඩසිටිමින් හෝ දම් දෙසන ඉරියව්වක සිටිමින් හෝ ගත් ඡායාරූපද ඒ අතර වේ. විහාරස්ථානයේ බුද්ධපූජාවට, බෝධිපූජාවට තමන් සම්බන්ධ වූ ආකාරයද ඡායාරූප මගින් පළකරති. ඇතැම් තරුණ හිමිවරුන් එහිදී හැසිරෙන්නේ බොළඳ දරුවන් මෙනි. එසේ නැතිනම් කෙළිලොල් චරිත මෙනි. මෙසේ ඕලාරිකව හැසිරෙන තරුණ භික්ෂුවකගෙන් සරු ඵලයක්, විචාරවත් පැවැත්මක් සහිත ඉදිරි ගමනක් කෙසේ බලාපොරොත්තු විය හැකිද? ඇතැම් අවස්ථාවල මුහුණුපොතේ පළකරන අදහස්වල සමබරතාවක් හෝ බහුවිධ දෘෂ්ටිකෝණයක් හෝ නැත. සපුරාම ඒකපාර්ශ්වීයය. මෙමගින් නිරූපණය වන තරුණ භික්ෂූන් වහන්සේගේ මානසිකත්වය ඉතාම දුක්ඛරය. ගිහි තරුණ තරුණියන්ගේ හැසිරීමට වඩා සුවිශේෂී වෙනසක් නොදක්නට ලැබේ.

භික්ෂූන් වහන්සේ නමකට ගැළපෙන ආධ්‍යාත්මික සංවරකමෙන් පමණක් නොව, බාහිර ඉරියව්වලින් හා හැසිරීම්වලින්ද,තවත් අයුරකින් පවසන්නේ නම්, බාහිර ප්‍රතිරූපය අතින්ද තරුණ භික්ෂූන් වහන්සේ කෙබඳු මට්ටමක සිටීදැයි විමසීම වැදගත් වේ. මජ්ඣිමනිකායේ මජ්ඣිම පණ්ණාසකයේ එන ධම්මචේතිය සූත්‍රයේ සඳහන් වන ආකාරයට වරක් බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට පැමිණි කොසොල් මහරජු බුදුගුණ හා සඟ ගුණ පිළිබඳ සිය අද්දැකීම් අනුසාරයෙන් පැහැදිලි කරයි. එහිදී භික්ෂූන් වහන්සේ අතර පවතින සංවරකම, සමගිය, ප්‍රසාදාවහ ගුණය යනාදිය රජු ඉතා ඉහළින් වර්ණනා කරයි. භික්ෂූන් වහන්සේගේ නිරවුල් පැවැත්ම රජෙකුගේ සිතසංසුන් කිරීමට කෙතරම් බලපෑවේද යනු මෙයින් පැහැදිලිය. අශෝක අධිරාජයාගේ ජීවිතය වෙනස් අතකට යොමුකෙරෙන ආකාරයේ

පසුබිමක් නිර්මාණය කිරීමේ පුරෝගාමියා වූයේ සත්හැවිරිදි නිග්‍රෝධ හිමියෝය. එබඳු ප්‍රසාදාවහ පරපුරකින් පැවත එන භික්ෂු පරපුරේ තරුණ පෙළ කෙබඳුදැයි දැන් විමසිය යුතුය. මෙකල සිටින ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා බෞද්ධ ජනතාව විසින් තමන්ට අනිවාර්යයෙන්ම ගරුකළ යුතු බව කල්පනා කරති. එහෙත් ගිහි ජනතාවගේ සිතේ ගෞරවය උපදින ආකාරය පිළිබඳ නොසිතති. තමන් මහත් කැපකිරීමක් කරන බවත් ගිහියන්ට ඒ පිළිබඳ කිසිදු තැකීමක් නොමැති බවත් පවසමින් මැසිවිලි නගති; ජනතාවගේ සිතේ ගෞරවය උපදින ආකාරය පිළිබඳ නොසිතුවද බසයේ නියමිත අසුනත් වෙනත් ස්ථානයක මූලිකත්වයත් ඒ හැරෙන්නට වෙනත් විශේෂ වරප්‍රසාද ආදියත් නො අඩුව බලාපොරොත්තු වෙති. මෙසේ අන් අයගේ ගෞරවය බලාපොරොත්තු වන්නේ තමන් නිසි පදනම මත පිහිටමින්දැයි තමන් වහන්සේලාගෙන්ම විමසීම වටී. යමෙකුගේ පැවිද්ද පිළිබඳ ත්‍රිපිටකයේ සූත්‍රයක සඳහන් කිරීමේදී 'කෙසමස්සුං ඔහාරෙත්වා පබ්බජි' (කෙස්රවුළු ඉවත් කර පැවිදි වූයේය) යනුවෙන් සඳහන් කර තිබුණදමෙකල ඇතැම් තරුණ භික්ෂූන් කල්පනා කරන ආකාරයට හා හැසිරෙන ආකාරයට කෙස්රවුළු කැපීම අවමානයකි. දන්පිලෙහි, පිරිත් මණ්ඩපයෙහි වැඩසිටින ගමන්ම වටාපතට මුවාවී හෝනොවී ජංගම දුරකතනයෙන් කෙටි පණිවුඩ යැවීමට හෝ මුහුණුපොතේ සැරිසැරීමට ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාට පවතින්නේ සූක්ෂ්ම දක්ෂතාවකි. මගීන් තෙරපී සිටින බසයට ගොඩවදින තරුණ භික්ෂූන් වහන්සේට ගිහියෙකු විසින් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් සිය අසුන පිරිනමයි. අනතුරුව එහි වැඩසිටින ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේද පෙර සඳහන් කළ කටයුත්ත කරති; ගිහි තරුණ තරුණියන් මෙන් විසිතුරු ලෝකයක ජීවත් වෙති. ගමනෙහි, කථාබහෙහි, සිනාවෙහි භික්ෂුවක් වශයෙන් පැවතිය යුතු සංවරකම ඇතැමෙකුගෙන් ගිලිහී ඇත. යම් තරුණ භික්ෂුවක් සංවරව ජීවත් වීමට උත්සාහ කරයි නම් එය ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා නිර්වචනය කරන්නේ 'අමුතු හැසිරීමක්' වශයෙනි. නොඑසේ නම් අමුතුම තාලයේ පුද්ගලයෙකු ලෙසයි. කිසියම් මානසික ගැටලුවක් තිබෙන අයෙකු ලෙසයි. ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ

මුහුණු දෙස බැලූ විට පාසලේ මූලික ශ්‍රේණිවල උගෙනුම ලබන ශිෂ්‍යයෙකුට පවා හැඟෙන දැනෙන යම් අදහස්වලට හේතුව දීර්ඝ කාලයක් මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කළ අයෙකුගේ ස්වභාවය ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලාගේ මුවෙන් ප්‍රකට වීමයි. මෙවැනි පසුබිමක නොපැහැදුණ ජනයාගේ පැහැදීමත් පැහැදුණ අයගේ වඩා පැහැදීමත් කෙසේ සිදුවන්නේදැයි ප්‍රශ්නයකි. කෙසේ වෙතත් සිය ලාභ ප්‍රයෝජන, කීර්ති ප්‍රශංසා ආදිය ඉලක්ක කරගෙන සුසිල්වතුන්ගේ ඉරියව්වලින් හැසිරෙන ඇතැමෙකුගෙ න්ද ප්‍රවේශම් විය යුතුය.

## උක්ත අවනතීන්ට හේතු හා ඒවා වළක්වාගැනීමට යෝජනා

ඉහතින් පැහැදිලි කළ තරුණ සමාජයේ අවනතීන්ට හේතු කවරේදැයි විමසා බැලීම වැදගත් වන්නේ ඒවා යම් පමණකින් හෝ සමනය කිරීමට අවශ්‍ය බුද්ධිමය සංවාදය පෝෂණය කරගැනීම සඳහාය. වර්තමාන තරුණ භික්ෂූන්ගේ මෙම තත්ත්වයන්ට තරුණ භික්ෂූන් පමණක් වගකිව යුතු නොවේ. උන්වහන්සේලාට අමතරව උන්වහන්සේලාගේ ආචාර්ය - උපාධ්‍යායයන් වහන්සේලාද භික්ෂු සංස්ථාවේ සෙසු ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලාද යන අංශ තුනටම මෙම අවනතිය පිළිබඳ වගකීමෙන් බැහැර විය නොහැකිය. සැකෙවින් පවසතොත් පෙර කී ස්තර තුනටම අයත් භික්ෂූන් මීට වගකිව යුතුය. මෙම අයහපත් තත්ත්වයන් එකවරම පහළ වූ ඒවා නොවන අතර සංඝ සමාජය තුළම නිර්මාණය වී සැලකිය යුතු කාලයක් පුරා සංවර්ධනය වූ තත්ත්වයන්ය. ඒ අනුව දීර්ඝ කාලයක් පුරා ව්‍යාප්ත වී ඇති, තරුණ - වැඩිහිටි සියලු දෙනා වගකිව යුතු අයහපතකට එක් පිරිසක් පමණක් ඉලක්ක කරගෙන චෝදනා කිරීම හෝ එකිනෙකාට චෝදනා කරගැනීම යන නිෂ්ඵල කටයුතුවලින් බැහැර වී සැමගේම යහපත උදෙසාත් වඩාත් යහපත් අනාගත භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම උදෙසාත් තම තමන්ගේ අඩුපාඩු, හේතු සාධක සහිතව හඳුනාගෙන කටයුතු කිරීම වඩා වැදගත් වේ.

ගුරු හිමියන් (මෙතැන් සිට ආචාර්ය - උපාධ්‍යායයන් වහන්සේලා හැඳින්වීමට මෙසේ යොදනු ලැබේ.) සිය ශිෂ්‍ය හිමිවරුන් ආරම්භයේ සිටම නිසි පරිදි මෙහෙයවීමෙන් බැහැර වීම තරුණ භික්ෂූන්ගේ මෙම අවනතීන්ට බලපෑ ප්‍රධාන හේතුවකි.

පැවිදි කිරීමේ අපේක්ෂාවෙන් දෙමව්පියන් විසින් සිය කුඩා දරුවන් ගුරු හිමියන් වෙත භාර දෙන්නේ බොහෝ බලාපොරොත්තු ඇතිවය. දෙමව්පියන්ගේ එම බලාපොරොත්තු ගුරු හිමියන් විසින් ඉටු කළ යුතු බව මෙහිදී අදහස් නොකළද එම කුඩා දරුවාගේ අනාගතය සුරක්ෂිත කිරීමේ, සනාථ කිරීමේ බලය හා වගකීම එතැන් පටන් පැවරෙන්නේ ගුරු හිමියන්ටය. එය කෙනෙකුගේ ජීවිතය සම්බන්ධ වගකීමකි, අනාගතය සම්බන්ධ වගකීමකි. තමන්ට දාව, සිය කුසෙන් උපන් දරුවන් වුවද තමන්ට අවනත කරගැනීම දෙමව්පියන්ට පවා අපහසු වන මෙකල ගුරු හිමිනමක් භාරගන්නේ බරපතල අභියෝගයකි. එතැන් පටන් ගුරු හිමියන් විසින් 'පුත්‍ර ස්නේහයෙන්'යුතුව එම දරුවා කෙරෙහි පැවතිය යුතුය. එය බුද්ධ අනුශාසනාවයි. පුත්‍ර ස්නේහය නම් මවක - පියෙකු තුළ සිය දරුවන් කෙරෙහි පවතින අකංලක සෙනෙහසයි. සිය ලෙයින් මසින් නූපන් දරුවෙකු දෙස එවැනි අකලංක චේතනාවකින් කටයුතු කළ හැක්කේ ආධ්‍යාත්මික වශයෙන් පෝෂණය වූ උතුම් ගුරු හිමිනමකටම පමණි. ගුරු හිමියන් සිය ශිෂ්‍ය හාමුදුරුවන් කෙරෙහි පුත්‍ර ස්නේහයෙන් යුතුව කටයුතු කිරීමේදී දෙමව්පියන් විසින් දරුවන් හට ඉටුකළ යුතු යුතුකම් ඉටුකිරීමේ වගකීම පැවරෙන්නේ ගුරු හිමියන් වෙතටයි. ඒ අනුව දෙමව්පියන් විසින් සිය දරුවන් යට ඉටුකළ යුතු යුතුකම් පහෙන් හතරක්ම ගුරු හිමියන් විසින් දෙමව්පියන්ගෙන් වියුක්තව සිය සෙවණේ සිටින ශිෂ්‍යයා වෙත ඉටු කළ යුතුය. එනම්,

පවෙන් වැළකීම (පාපා නිවාරෙන්ති)

යහපතෙහි යෙදවීම (කල්‍යාණෙ නිවෙසෙන්ති)

ශිල්ප ඉගැන්වීම (සිප්පං සික්ඛාපෙන්ති)

සුදුසු කල උරුම වූ වස්තුව පැවරීම (සමයෙ දායජ්ජං නියාාතෙන්ති)

යනුවෙනි. මෙම යුතුකම්වලින් ආවරණය වන අංශ හතර ගිහියෙකුගේ පමණක් නොව පැවිද්දෙකුගේ ජීවිතය පෝෂණය වීමටද යහපත් බලපෑමක් සිදුකෙරේ. විශේෂයෙන්ම මෙහි සිව්වැනිව දැක්වූ කරුණ පැහැදිලි කර ගත යුතුය. ගුරු හිමියන්

විසින් සිය ශිෂ්‍ය ස්වාමින් වහන්සේලා හට භෞතික වූ දේපල පැවරීමට වඩා පැවිදි ජීවිතය අර්ථවත් කර ගැනීමට අවැසි පුහුණුව නමැති වස්තුව නියමිත පරිදි දිය යුතුය. භික්ෂූන්ට අවැසි දායාදය, වස්තුව එයයි.

මීට අමතරව ගුරු හිමියන් විසින් සිය ශිෂ්‍යයන් හට යුතුකම් පහක් ඉටුකළ යුතු  බව බුද්ධ දේශනාවයි. ගුරුවරයා විසින් සිය ශිෂ්‍යයා වෙත යුතුකම් පහක් ඉටුකළ යුතු බව බුදුරදුන් සිගාලෝවාද සූත්‍රයේදී දක්වයි. එනම්,

ශිෂ්‍යයා මැනවින් හික්මවීම (සුවිනීතං විනෙන්ති)

ශිෂ්‍යයාට මැනවින් ඉගැන්වීම (සුග්ගහිතං ගාහාපෙන්ති)

තමන් අසාගත් සියලු ශිල්ප ශිෂ්‍යයාට මැනවින් කියාදීම (සබ්බසිප්පසුතං සමක්ඛායිනො භවන්ති)

මිතුරන්ට හඳුන්වා දීම  (මිත්තාමච්චේසු පටියාදෙන්ති)

දිශාවන්හි ආරක්‍ෂාව සැලසීම (දිසාසු පරිත්තානං කරොන්ති) යනුවෙනි.

ගුරුවරයා විසින් සිය ශිෂ්‍යයා හට හුදෙක් ශාස්ත්‍රඥානය පමණක් දීම බෞද්ධ අධ්‍යාපන පටිපාටිය නොවේ. පළමුව ශිෂ්‍යයා මැනවින් හික්මවා, ආචාරශීලී අයෙකු - ගුණවතෙකු බවට පත් කර පසුව ඥාන සම්ප්‍රදානය බුදුදහමේ අනුමත පටිපාටියයි.ඊට ගිහි - පැවිදි භේදයක් නොමැත. මෙහිදී විශේෂයෙන් පැහැදිලි කරගත යුතු කරුණක් ඇත. එනම් ගුරු හිමියන්ගේ කාර්යභාරයේ හා ශාස්ත්‍රඥානය ලබාදෙන ගුරුවරයාගේ කාර්යභාරයේ සීමාවන්ය. ශාස්ත්‍රඥානය ලබාදෙන ගුරුවරයා යටතේ ශිෂ්‍යයා රැඳී සිටින්නේ ශාස්ත්‍ර හදාරන තෙක් පමණි. එහෙත් ආචාර්ය ස්වාමින් වහන්සේ එසේ නොවේ. උන්වහන්සේ ශිෂ්‍ය ස්වාමින් වහන්සේ සමග යාවජීව බැඳීමකින්, වගකීමකින් කටයුතු කරන චරිතයකි. එහෙයින් සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ඉහත සඳහන් කළආචාර්ය - අන්තේවාසික යුතුකම්වලට වඩා පුළුල් බැඳීමක් ආචාර්ය උපාධ්‍යාය - අන්තේවාසික දෙපිරිස අතර පවතී.

මෙකල ඇතැම් විහාරස්ථානවල, විශේෂයෙන්ම ඇතැම්

පරිවේණ ස්ථානවල සිදුවන අදූරදර්ශී වැඩපිළිවෙළක් පිළිබඳවද සඳහන් කළ යුතුය. එනම්, අවශ්‍ය වත්පිළිවෙත් ආදිය හා උගතමනා බණ දහම් ඇතුළුව ශාසනික චාරිත්‍ර විධි ආදිය නූගන්වා ඉතා කෙටි කාලසීමාවක්තුළ කුඩා දරුවන් පැවිදි කිරීමයි. මේ කටයුත්ත සිදුකරන වැඩිහිටි භික්ෂූන් වහන්සේලා භික්ෂූන්ගේ ප්‍රමාණාත්මක වටිනාකම පිළිබඳ හෝ වෙනත් යම් යම් කාරණා පිළිබඳ සලකා එසේ 'කඩිනම් පැවිදි කිරීම්' සිදු කරනවා විය හැකිය. ඇතැම් කුඩා දරුවන් පැවිදි වීමට පෙර විහාරස්ථානයේ රැඳී සිටින්නේ පැය ගණනකි. නැත්නම් දින කිහිපයකි. නිවසේ සිට විහාරස්ථානයට පැමිණි වහාම පැවිදි වන්නෙකුට පැවිදි ජීවිතයේ තිබෙන වැදගත් අංශ, වගකීම තවත් සරලව කිවහොත් පැවිදි ජීවිතයේ බරපතලකම කෙබඳුදැයි ස්වයං අවබෝධයක් ලබාගැනීමට අවස්ථාවක් නොලැබේ. ඒ හේතුවෙන් එම කුඩා ස්වාමින් වහන්සේට භික්ෂු ආකල්ප පිළිබඳ වැටහීමක් නොමැති වන අතර ගිහි ජීවිතයේත් පැවිදි ජීවිතයේත් සැබෑ වෙනස තේරුම් ගැනීමට අවස්ථාවක් නොලැබේ. මූලික අවධියේදී මේ අවබෝධය නොමැතිව සසුන්ගත වී ක්‍රමයෙන් තරුණ වයසට පත් වන භික්ෂූන් වහන්සේගෙන් උදාර ආගමික අර්ථ චර්යාවක් තබා පැවිද්දෙකු තුළ පැවතිය යුතු මූලික සංවරයවත් බලාපොරොත්තු වීම නිෂ්ඵල දෙයකි. මේ අනුව පැහැදිලි වන්නේ කඩිනම් පැවිදි කිරීමේ ව්‍යාපෘති හරහා සිදුව ඇත්තේ ශාසනික වශයෙන් ඉතා ඛේදනීය තත්ත්වයක් නිර්මාණය වී ඇති බවයි. එහි වගකීම බැඳී තිබෙන්නේ තරුණ භික්ෂූන් වහන්සේ සමග නොවෙයි. ගිහි බෞද්ධ ජනතාව සමගද නොවේ. වැඩිහිටි භික්ෂූන් සමගයි.

කුඩා දරුවෙකු පැවිදි කිරීමට පෙර කිසියම් සැලකිය යුතු කාලසීමාවක් ගුරු හිමියන්ගේ මගපෙන්වීම යටතේ විහාරස්ථානයේ තබා ගැනීම අංශ කිහිපයකින් වැදගත් වේ. මීට පෙරද සඳහන් කළ පරිදි තමන් එළඹීමට නියමිත පැවිදි ජීවිතය පිළිබඳ යම් වැටහීමක් ලබාගැනීමට අවස්ථාව ලැබීම ඒ අතර ප්‍රධාන වේ.ඒ හැරුණු විට මේ කාලසීමාවේදී ගුරු හිමියන් විසින් ආධුනිකයා හට විහාරස්ථානයේ සිදු කෙරෙන වත්පිළිවෙත්, ආගමික චාරිත්‍ර විධි ආදිය යම් පමණකට හෝ පුරුදු කිරීම පෞරාණික චාරිත්‍රයයි.

එසේ ලබන පූර්ව ශික්ෂණය පැවිදි ජීවිතයේ සාර්ථකත්වයට ජීව සාධකයක් වේ. නිවසෙන් බැහැරව පැමිණි කුඩා දරුවෙකුට තනිවම, නවතම සමාජයක් ඇසුරු කිරීමට, තමන් විසින්ම (හුදෙකලාවම) සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට හා සමාන වයසේ ගිහි - පැවිදි ජනයා සමග සමගිව හා සුහදව කටයුතු කිරීමට අවකාශය ලැබෙන මේ අවධිය යමෙකුගේ පෞරුෂ සංවර්ධනයටද වැදගත් අවධියකි. ඊට අමතරව අධ්‍යාපනික අතින්ද මෙම කාල සීමාව වැදගත් වේ. විහාරස්ථානයේදී ගුරු හිමියන්ගෙන්, වැඩිහිටි හිමිවරුන්ගෙන් ලැබෙන අක්ෂර ශික්ෂණය, වනපොත් කිරීම, අනෙකුත් උගතමනා බණදහම් උගෙනීමද මේ මූලික කාල සීමාවේ සිදුකරනු ලැබේ. මේ අනුව සාර්ථක පැවිදි ජීවිතයකට අවැසි මූලබීජ සැපයෙන්නේ මේ අවධියේදීය. මේ කාලසීමාවේදී මනා පදනමක් සහිතව අරඹන පැවිදි ජීවිතයේ බාල, තරුණ, මහලු වැනි භේදයකින් තොරව පවතින්නේ යහපතයි. එහි භික්ෂු ආකල්පවල ඌනතාවක් නොමැත. ඒ අනුව මේ වටිනාකම තරුණ භික්ෂූන් වහන්සේගේ ජීවිතයට එක් කිරීමේ පුරෝගාමී චරිතය විය යුත්තේ ආචාර්යයන් වහන්සේය.

පුද්ගලයෙකුගේ චරිත සංවර්ධනයටද පෞරුෂ සංවර්ධනයටද මානසික නිරවුල් බවටද අත්‍යවශ්‍ය වන්නේ ආදරය, කරුණාව වැනි උතුම් මානව ගුණ ධර්මයෝය. ගුරු හිමියන් විසින් සිය ශිෂ්‍යපුත්‍රයන් වහන්සේලා කෙරෙහි පුත්‍රස්නේහයෙන් යුතුව කටයුතු කළයුතු බව ඉහතද සඳහන් කරන ලදි. කුඩා කාලයේදීම දෙමව්පියන්ගේ ආදරයෙන්ද සහෝදර සහෝදරියන්ගේ හා නෑදෑ හිතමිතුරන්ගේ ඇසුරෙන්ද ඉවත් වූ දරුවෙකුගේ මානසිකත්වය මැනවින් තේරුම්ගෙන නිසි ආදරයෙන්, සෙනෙහසින් රැකබලා ගනිමින් සුදුසු පරිදි මෙහෙයවීම ගුරු හිමියන්ගේ චරිතයේ අනිවාර්ය ලක්ෂණයකි. ආදරය - කරුණාව මධ්‍යයේ තැනෙන, තරුණ වයසට පත්වන භික්ෂූන් වහන්සේගේ සිතේ සිය ගුරු හිමියන් පිළිබඳවත් සමාජය පිළිබඳවත් භික්ෂු සංස්ථාව පිළිබඳවත් පවතින්නේ ආදරයකි, කරුණාවකි, ළෙන්ගතුකමකි. සිය ගුරු හිමියන් පිළිබඳ කළකිරීමෙන් මෙකල ඇතැම් තරුණ භික්ෂූන් උපැවිදි වුවද සිය ගුරු හිමියන්ගේ සිත රිදවීමට තිබෙන අකමැත්ත

හේතුවෙන්ම වෙනසක් පිළිබඳ නොසිතන ආකාරයේ තරුණ භික්ෂූන් වහන්සේලාද මෙකල වැඩසිටින බව අමතක නොකළ යුතුය. තරුණ භික්ෂුවගේ ආකල්ප හා චර්යා කෙරෙහි ගුරු හිමියන්ගේ බලපෑම කෙතරම්දැයි එමගින් මැනවින් තේරුම්ගත හැකිය.

ගුරු හිමියන්ගේ ආදර්ශ සම්පන්නතාවද තරුණ භික්ෂුවකගේ ජීවිතයට යහපත් බලපෑමක් ඇතිකරයි. ශාසනික කටයුතුවලදී ගුරුහිමියන්ගේ යහපත් ක්‍රියාකලාපය, තුනුරුවන් කෙරෙහි සැදැහැවත් බව, සමාජ සම්බන්ධතා නිරවුල්ව පවත්වාගෙන යාම, වත්පිළිවෙත්වල අනලස්ව නිරත වීම, සිල්වත් - ගුණවත් පැවැත්ම, යහපත අගය කිරීමේත් අයහපත බැහැර කිරීමේත් ඍජු ගතිය යන කාරණා ගුරු හිමියන්ගේ චරිත ලක්ෂණ දෙස බලාසිටින කුඩා භික්ෂුවගේ චරිතයටද යහපත් බලපෑමක් ඇතිකරයි. එය එම ශිෂ්‍ය භික්ෂුවගේ ජීවිතය යම් මට්ටමකට හෝ උසස් කරගැනීමට ඉවහල් වේ.

කාලීන අවශ්‍යතාවන් පිළිබඳ සලකා සාධනීය වෙනස්කම් කෙරෙහිද අවධානයෙන් යුතුව ශිෂ්‍ය හිමිවරුන් තැනීමට කල්පනා කිරීමද ගුරු හිමිවරුන් සැලකිලිමත් විය යුතු තවත් අංශයකි. ගුණ ගරුක, සිල්වත් ඇවතුම් පැවතුම් මෙන්ම අධ්‍යාපනික අංශයේ අභිවෘද්ධිය වෙත ශිෂ්‍ය හිමියන් යොමු කර වඩාත් ශක්තිමත් හා කුශලතා, දක්ෂතා සපිරි තරුණ භික්ෂූන් වහන්සේ නමකට පමණි වර්තමානයේ තරුණ තරුණියන් සමග නොගැටී, එක් ගමනක් යා හැකි වන්නේ. භික්ෂු ගරුත්වය රැකෙන පරිදි එවැනි නව අධ්‍යාපන ක්ෂේත්‍ර වෙත යොමු වීමද අත්‍යවශ්‍යය. ඇතැම් උගත් තරුණ භික්ෂූන් වහන්සේලා මැසිවිලි නගන්නේ තම උගත්කම හා ගුරු හිමියන්ගේ නූගත්කම යන හේතු දෙක එකී දෙපිරිස අතර බොහෝ ගැටුම්වලට හේතුව වී ඇති බවයි. පුත්‍ර ස්නේහයෙන් කටයුතු කරන ගුරු හාමුදුරුවන් වහන්සේට එවැනි ඊර්ෂ්‍යා පරවශ හැසිරීම් කිසි සේත් නොගැළපේ.

මෙකල බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා අපහසුතාවට පත්වන එක් අවස්ථාවක් නම් ආගමික කටයුතු මෙහෙයවන අවස්ථාවයි. ආගමික කටයුතු යනු පැවිදි ජීවිතයේ මගහැරිය

නොහැකි අංශයකි. එහෙත් ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා බණ දහම් කීමහෝ වෙනත් ආගමික කටයුතු මෙහෙයවීමෙහිලා අපොහොසත් වෙති. ඊට නිසි පුරුද්දක් උන්වහන්සේලාට නොමැත. එහෙයින් බොහෝ විට ගිහි ජනතාව ඉදිරියේත් සෙසු ලොකු කුඩා භික්ෂූන් වහන්සේලා ඉදිරියේත් උන්වහන්සේලා අසරණ වෙති; අපහසුතාවට පත්වෙති. මේ පිළිබඳ වගකීමක්ද ගුරු හිමියන්ට තිබේ. කුඩා අවධියේ පටන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ හට ආගමික කටයුතු මෙහෙයවීමේ පුරුද්ද ලබාදීම ඉතා වැදගත් වේ. එය එකවරම කළ හැක්කක් නොවන හෙයින් කුඩා අවධියේ සිට අනුක්‍රමයෙන් ප්‍රගුණ කළ යුත්තකි. එම කටයුතු සිදුකිරීමේදී මතු වන අඩුපාඩුකම් හෝ දුර්වලතාවන් කරුණාවෙන්, මෛත්‍රියෙන් පෙන්වා දෙමින් මගපෙන්වීම අත්‍යවශ්‍ය වේ. තරුණ භික්ෂූන් වහන්සේගේ පෞරුෂයට මෙන්ම ආත්ම විශ්වාසයටද මෙය ප්‍රබලව බලපාන කරුණකි. මේ අනුව පෙනී යන්නේ වර්තමාන තරුණ භික්ෂූන් වහන්සේගේ යහපත් පැවැත්ම සාධනය කිරීම සඳහා වැඩි කාර්යභාරයක් ඉසිලිය යුත්තේ ගුරු හිමියන් විසින් බවයි. බුදුරදුන් අනුදැන වදාළ පරිදි පුත්‍ර ස්නේහයෙන් හා පිතෘ ස්නේහයෙන් කටයුතු කිරීමෙන් පමණක් අන්‍යොන්‍ය වශයෙන් ගුරු සිසු දෙපක්ෂයේ නිරවුල් ප්‍රගමණය සාධනය කරගත හැකිය.

මෙකල තරුණ භික්ෂූන් අතර පවතින යම් යම් දුර්වලතාවන්ට බලපෑ අනෙක් කරුණ වශයෙන් සැලකිය හැක්කේ ආදර්ශවත් භික්ෂු නායකත්ව චරිතවල ඌනතාව හා අතීතයේ සිටි ශ්‍රේෂ්ඨ නායකයන්ගෙන් පාඩම් නූගෙනීමයි. මෙකලද 'නායක' යන විශේෂණය දරන බොහෝ භික්ෂූන් වහන්සේලා සිටිති. මහානායක හිමිවරුද කිහිප නමක්ම වැඩසිටිති. එහෙත් ශ්‍රේෂ්ඨ නායකයන් ඉතා අඩු යැයි හැඟෙන්නේ භික්ෂු සංස්ථාවේ වර්තමාන පැවැත්ම පිළිබඳ විමසන විටයි. ශ්‍රේෂ්ඨ සංඝනායකවරුන් සෙවීමට බොහෝ අතීතයට යායුතු නොවේ. බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි, මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමි වැනි මෑතකාලීන සංඝපිතෘන් වහන්සේලාගේ චරිතවල පරමාදර්ශී ලක්ෂණ පිළිබඳ පමණක් විමසුවද වර්තමාන තරුණ භික්ෂූන්ටද මෙකල සිටින නායකකාරකාදින් ඇතුළු සමස්ත භික්ෂූන්ට ගත

හැකි ආදර්ශ බොහෝය. උන්වහන්සේලා පළමුවත් දෙවැනිවත් තෙවැනිවත් සිය ජීවිතයේ ප්‍රධානත්වය ලබාදුන්නේ පැවිදි ජීවිතයටයි. ධර්මශාස්ත්‍රීය සේවය අතින්ද උන්වහන්සේලා නොදෙවෙනි වූහ. දේශපාලන පක්ෂවලට බෙදී කටයුතු කිරීමක් හෝ දේශපාලනඥයන්ගේ ගුණ වැයීමක් හෝ උන්වහන්සේලා ප්‍රිය නොකළහ. යහපත ඉතා ඉහළින් අගය කළහ. අයහපත නිර්දයව බැහැර කළහ. එය භික්ෂු නායකයෙකු සතු විය යුතු ඍජුප්‍රතිපන්නතාවයි. මේ සියල්ල අතර උන්වහන්සේලා සාමාන්‍ය ජනතාව, සාමාන්‍ය සමාජය සමග මුසු වී කටයුතු කළහ. ප්‍රභූන් දේශපාලනඥයන් මෙන් ආරක්ෂකයන් පිරිවරා වැඩනොසිටියහ. දේශපාලනඥන්ට, ධනවතුන්ට, බලවතුන්ට පමණක් නොව රටේ සාමාන්‍ය ජනතාවටද දැක මුණ ගැසී කථාබහ කළ හැකි මට්ටමේ සාමාන්‍ය ජීවිත ගතකළහ. ප්‍රභූන්ට, දේශපාලනඥයන්ට පමණක් පිරිත් නූල් ගැටගැසීම උන්වහන්සේලාගේ ප්‍රතිපත්තිය නොවීය. උන්වහන්සේලා සිල්වත් වූහ; ගුණවත් වූහ; ශ්‍රද්ධාවන්ත වූහ; ධාර්මික වූහ. උන්වහන්සේලාට තිබූ වටිනාම ආරක්ෂාව වූයේ දූෂිත දේශපාලනඥයන් ආරක්ෂාකරන, අවි අතින් ගත් පොලිසියේ හෝ හමුදාවේ ආරක්ෂාව නොව, ධර්මයේ ආරක්ෂාවයි. දහම් පොතපත කියවා ප්‍රගුණ කරගත් උසස් ගණයේ ධර්මඥානයකින් උන්වහන්සේලා කටයුතු කළහ. උන්වහන්සේලා පෙලපාළි, මහා ජනරැළි ආදිය සංවිධානය නොකළද ඒවායේ කථිකයන් හා නියමුවන් නොවුවද රටටත් ජාතියටත් ආගමටත් අසීමිතව ආදරය කළහ; අවශ්‍ය වූ විට අවශ්‍ය පරිදි නොබියව හඬ නැගූහ; ප්‍රදර්ශනකාමයෙන් නොපෙළුණු අතර සියල්ලට ප්‍රථමව තමන් භික්ෂුවක් බැව් සිහියේ තබාගෙන හැසිරුණහ.

අද වන විට ගිහි සමාජයේ තරුණ තරුණියන් බොහොමයකට ශ්‍රේෂ්ඨ ජාතික වීරවරුන් හා නායකයන් පිළිබඳ අමතක වී ඇත. ඊට සාපේක්ෂව පැවිදි සමාජයටද ගිහි - පැවිදි ශ්‍රේෂ්ඨ නායකයන් අමතක වී තිබේ. එවිට ඇති වන හිඩැස පිරවීමට අද බොහෝ නායකයෝ භික්ෂු සමාජය තුළ පහළ වී ඇත; දිනපතා පහළ වෙති. ඒ අතර සිටින බහුතරයක් නායකයන් දැනුමෙන්, ආකල්පවලින්, කුශලතාවන්ගෙන්, හැකියාවන්ගෙන් පමණක් නොව වයසින්ද

අපරිණතය. දින, සති, මාස කිහිපයක් තුළඇති වන මේ වර්ගයේ නායකයන් සිය නායකත්ව ලක්‍ෂණ ලෙස සලකන්නේ කලහකාරී හැසිරීම, බොහෝ වේලාවක් නිර්දය ලෙස අන්‍යයන්ට බැණ වැදීම, පහර දීම, මිනිසුන්ගේ ආවේග ඇවිස්සීම, උස් හඬින් කථා කිරීම, ජාතික කොඩි - බෞද්ධ කොඩි වැනි වටිනා සංකේත අතේ දරමින් සටන් පාඨ කියමින් හා ප්‍රදර්ශනය කරමින් පෙලපාළි යෑම, විවිධ ඒකපාක්‍ෂික පාඨ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම හා අන්‍යයන්ද එසේ කිරීමට පෙලඹීම වැනි දේවල්ය. මොවුන්ගේ ශීඝ්‍ර ජනප්‍රියත්වය සඳහා ෆේස්බුක් වැනි සමාජ ජාල තෝතැන්නකි. මේ අලුත් නායකවරුන් බොහොමයකට භික්‍ෂු ආකල්ප පිළිබඳ හැඟීමක් හෝ අවබෝධයක් නැත. එවැනි දේ පිළිබඳ තැකීමක්ද නැත. දූර්දර්ශී ඥානයක් නැත. විචාරශීලීත්වයක්ද නැත. පෙර පිනක් හේතුවෙන් හෝ ලද මුඛරි බවක්ද වහා කිපෙන සුලු බවක්ද පමණකි මේ අතර බහුතරයකට ඇත්තේ. සැම දෙනාගෙ 'ම කෙසේ වෙතත් මේ අතර සිටින ඇතැම් නායකවරුනගේ අරමුණ තමන් වටා කිසියම් සමාජ බලයක් ගොඩනගාගැනීම විය හැකි යයි සිතේ. සමාජය තුළ, විශේෂයෙන්ම තරුණ තරුණියන් අතර ආකර්ෂණීය චරිතයක් වීම, මාධ්‍ය හමුවේ පෙනී සිටීම එහි අනෙක් ආශාවන් විය හැකිය. මේ අපරිණත නායකයන් අවසානයේදී සිය පිරිවරද පාවා දෙමින්කපටි දේශපාලනඥයන්ගේ ඉත්තන්, ගැත්තන් බවට පත්වීමට ගතවන්නේ කෙටි කාලයකි. ඇතැමුන් මෙසේ නායකයන්ගේ ස්වරූපයෙන් ඉදිරිපත් වන්නේ දේශපාලනඥයන්ගේ අරමුණු ඉටු කිරීම සඳහාමය.

මෙසේ විස්තර කළ නායකයන්ගේ ප්‍රධාන ඉලක්කය වන්නේ ගිහි - පැවිදි තරුණ පිරිසයි. එම තරුණ පිරිස අතර වීරයන් වීම ඔවුන්ගේ ප්‍රබල අපේක්‍ෂාවයි. මේ ඊනියා නායකයන් විශ්වාස කර ඔවුන්ගේ අනුගාමිකයන් වූ ඇතැම් තරුණ භික්‍ෂූන් වහන්සේලා හැසිරෙන ආකාරය මෑත කාලයේ අවස්ථා කිහිපයකදීම රටටම ප්‍රසිද්ධියේ දක්නට ලැබුණි.

මේ නායකවරුන් හැරුණ විට නිකාය, පාර්ශ්වය ආදිය නියෝජනය කරන තවත් නාවකවරු බොහෝ පිරිසක්ද සිටිති. ඒ අතරින් ඇතැම් නාහිමිවරුන්ඡන්ද, දෝස, භය, මෝහ යන

සතර අගතියෙන්ම අගතියට ගොසිනි.දේශපාලනඥයන්ගේ අනුගාමිකයන් බවට පත්වීම හාසිය වටිනාකම තේරුම් නොග ැනීම හේතුවෙන් භික්ෂුවක් වශයෙන් තමන්ට හිමි ගෞරවය කෙලෙසාගෙන ඇත.ඇතැම්හු කුල, ගෝත්‍රාදියට මූලිකත්වය දෙමින් ක්‍රියා කරති. සමහරුන්ට නොයෙකුත් චෝදනා එල්ල වේ. ඇතැමෙක් උත්සාහ කරන්නේ තමන්ගේ බැබළීම සනාථ කර ගැනීමටයි, සිය සුඛවිහරණයටයි. ඔවුහු පරාර්ථකාමික්වය නොහඳුණති. ධර්මය පිළිබඳ දැනුම හා අවබෝධයත් ඒ මත ගොඩනැගුණු ජීවිතාවබෝධයත් අඩුය. තනතුරුවලින් සතුටු වෙමින් දිවි ගෙවති. මෙම දෝෂ සහගත හැසිරීම යම් පමණකට හෝ නිවැරදි නොවේ නම් මෙකල ස්වල්ප වශයෙන් හෝ වැඩසිටින යහපත් භික්ෂු නායකයන් ඉස්මතු නොවේ නම් හෝ තරුණ භික්ෂූන්ගේ අවනතිය දුරුකිරීමට තබා පාලනය කිරීමටවත් අසීරු වන බව පැහැදිලි කරුණකි.තරුණ භික්ෂූන් වහන්සේ වෙත ඉතා ශක්තිමත් පණිවුඩයක් ලබාදීමට ආදර්ශ සම්පන්න භික්ෂු නායකයෝම නිස්සෝ වෙති.

තරුණ භික්ෂූන්වහන්සේ වෙතින් ගිලිහී යන ධර්මඥානයේ හා භාෂාඥානයේ ඌනතාවද මෙහිදී අවධානය යොමු කළ යුතු තවත් වැදගත් පැතිකඩකි. භික්ෂූන් වහන්සේ මේ දෙ අංශයෙන්ම සමන්විත වීමේ අවශ්‍යතාව මීට පෙරද පැහැදිලි කරන ලදි. නූතනය වන විට පරිගණක සාක්ෂරතාව වැනි අංශද මීට එකතු වී ඇති බව අමතක නොකළ යුතුය.මේ අංශවලින් තරුණ භික්ෂූන් වහන්සේ දුරස් වීම හරහා උන්වහන්සේ වෙත ගොනු වී ඇති ආගමික බලයත් ශාස්ත්‍රීය බලයත් සමාජ බලයත් අවදානමට ලක්වේ. ඒ හැරුණු විට භික්ෂු ජීවිතයේ අනන්‍යතාව බිඳවැටීමටද විශාල හේතුවකි. ධර්මඥානයත් භාෂා ශාස්ත්‍රඥානයත් මෙකල එතරම් අපහසු කටයුත්තක් නොවන්නේ පුරාතන හා නූතන මූලාශ්‍රයන් වෙත ඉතා කඩිනමින් හා පහසුවෙන් ප්‍රවේශ වීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය වී ඇති හෙයිනි. අඩුවක්ව පතින්නේ එම මූලාශ්‍ර භාවිත කරන්නන් පමණි. කාලානුරූපව ඕනෑම සංස්ථාවක උද්ගත වන ව්‍යසනකාරී තත්ත්වයක් ලෙස මෙය සිතීම යුක්ති සහගත නොවන්නේ ඒ කෙරෙහි බලපෑ හේතු

කිහිපයක්ද ඒ වටා ගොනු වී ඇති හෙයිනි. විශේෂයෙන්ම නූතන අධ්‍යාපන ප්‍රතිපත්ති හෝ වැඩසටහන් සමග භික්ෂු අධ්‍යාපනය යා කළ හැකිදැයි විමසා බැලීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා ලබාදිය හැකි හොඳම නිදර්ශනය මෙකල මෙරට විශ්වවිද්‍යාලයවල ක්‍රියාත්මක වන සමාසික අධ්‍යයන ක්‍රමයයි. බුද්ධ ධර්මය පිළිබඳ හෝ භික්ෂු අධ්‍යාපනයට අදාළ වන භාෂාශාස්ත්‍ර පිළිබඳ සමාසික ක්‍රමය හරහා ක්‍රමවත්ව හා හරවත්ව ඉගැන්විය හැකි වේදැයි හා හැදෑරිය හැකි වේදැයි මූලික විමර්ශනයක් මෙතෙක් මෙරට සිදු වූයේදැයි විමසිය යුතුය. මෙහිදී සිදුව තිබෙන්නේ විදේශීය අධ්‍යාපන ක්‍රමවේද තුළට නිසි විමර්ශනයකින් හෝ අත්හදා බැලීමකින් තොරව මෙරට භික්ෂු අධ්‍යාපනයේ ආවේණිකාංග ඇතුළු කිරීමයි. එම ක්‍රමවේද ඇතැම් විෂයක්ෂේත්‍රවලට අනුරූප වුවද මෙහිදී සාකච්ඡාවට ගැනෙන භික්ෂු අධ්‍යාපනයේ විෂයක්ෂේත්‍ර සමග ගැළපේද යනු ප්‍රශ්නයකි. එහෙයින් සිදු කළ යුතුව ඇත්තේ තරුණ භික්ෂූන් හට ධර්මඥානය හා භාෂාශාස්ත්‍රඥානය ලබාදීමේ විකල්ප ක්‍රමවේද පිළිබඳ අවධානය යොමු කිරීමයි. පැරණි පැවිදි පඬිවරුන්ගේ හා වර්තමාන පැවිදි පඬිවරුන්ගේ දැනුම් මට්ටමෙහි කැපී පෙනෙන වෙනසක් තිබෙන බව බොහෝ දෙනා කථාකරන මාතෘකාවකි. එයට හේතුව භික්ෂූන් වහන්සේ කේන්ද්‍ර කරගත් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ හා විදේශීය අධ්‍යාපන ප්‍රතිපත්ති මූලික කරගත් වර්තමාන භික්ෂු අධ්‍යාපන ක්‍රමයේ සීමා මායිම්, අරමුණු හා ක්‍රමවේද එකිනෙකට නොගැළපීමයි. සාම්ප්‍රදායික භික්ෂු අධ්‍යාපනයෙන් උරුම වූ පුළුල් දැනුමත් නූතන අධ්‍යාපන ක්‍රමයෙන් ඉලක්ක කෙරෙන විචාරශීලීත්වයත් මුසු වූ කිසියම් නවමු ආරක අධ්‍යාපන රටාවක් හෝ ක්‍රමවේදයක් හරහා දැනුමෙන් හා විචාරශීලීත්වයෙන් සපිරි තරුණ භික්ෂු පිරිසක් පිළිබඳ අපේක්ෂා තබාගත හැකි වනු ඇත. සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ තිබෙන වනපොත් කිරීම වැනි ක්‍රමවේදවල නොගැළපීම පිළිබඳ ඇතැම් මතවාද,අදහස් මෙකල පළ වුවද භික්ෂූන් වහන්සේ නමක් නිර්මාණය කිරීමේදී එවැනි අධ්‍යාපන රටාවකින් ලැබෙන දායකත්වය පිළිබඳවද අමතක කළ නොහැකිය. අවශ්‍ය වන්නේ වනපොත්කරණයට සාපේක්ෂව ඒ පිළිබඳ පුළුල් විචාරයක්ද ශිෂ්‍ය භික්ෂූන් අතර ගොඩනැගීමට නිසි පරිසරය නිර්මාණය කිරීමයි.

සාම්ප්‍රදායික පාඨ්‍ය ග්‍රන්ථ අධ්‍යයනයද පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක බව ආරක්‍ෂා කරගැනීමට හේතුවකි. එහෙත් ඊට අමතරව සාහිත්‍ය කලා විෂයයන් පිළිබඳවත් අනාගතයේ වැදගත් ක්‍ෂේත්‍රවලට යොමුවීමට අවශ්‍ය පුහුණුව සාම්ප්‍රදායික පාඨ්‍ය ග්‍රන්ථවලින් සපයන්නේ කෙසේදැයි මූලික අදහසක් හෝ ශිෂ්‍යයා හට ඒත්තු ගැන්වීම එම විෂයයන් පිළිබඳ ශිෂ්‍යයන්ගේ ආකල්පය වඩා යහපත් වීමටද හේතු වේ. පාලි, සංස්කෘත, සිංහල, ත්‍රිපිටක ධර්මය වැනි විෂයවලට ලබාදෙන ප්‍රමුඛතාවට සමාන මට්ටමක් ගණිතය, ඉංග්‍රීසි, ඉතිහාසය, සමාජ විද්‍යාව, පරිගණක තාක්‍ෂණය වැනි විෂයවලටද ලබාදීමෙන් පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්ගේ දැනුම් මාර්ග පුළුල් වේ. නූතන පරපුර සමග නොගැටී ගමන් කළ හැකි, සමාජමය හා ශාස්ත්‍රීය වටිනාකමකින් හෙබි තරුණ භික්ෂූන් වහන්සේ නමක් නිර්මාණය කිරීමට අවැසි ශක්තිය එහි ඇතුළත් වේ යැයි සිතිය හැකිය. මේ සියල්ල කළ හැක්කේ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ පවතින ඌනතා හඳුනාගෙන සිදුකෙරෙන විධිමත් ප්‍රතිශෝධනයකින්ම පමණි. කෙසේ වෙතත් එය කළ හැකි නම් තරුණ භික්ෂූන් වහන්සේ වෙනුවෙන් සිදුකෙරෙන මහත් යහපත, ආයෝජනය එයමය. පිරිවෙන් අධ්‍යාපනය යනු සපුරාම ආගම පදනම් කරගෙන සිදුකෙරෙන්නක් වන හෙයින් තරුණ භික්ෂූන් වහන්සේලාගේ භික්ෂු ආකල්ප, චර්යා ආදි ගුණාත්මක සංවර්ධනයේදීද ගුරු හිමියන්ට නොදෙවෙනි වගකීමක් පිරිවෙනටද පවතී.

බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලාට තමන් පිළිබඳවත් තම වටිනාකම, අනන්‍යතාව හා සීමාමායිම් පිළිබඳවත් අමතක වීම පෙර සඳහන් කළඅවනතීන්ට බලපෑ තවත් හේතුවකි. මෙය බොහෝ දුරට ආගමික ශික්‍ෂණයෙන් තොර වූ තාරුණ්‍යය හේතුවෙන් හටගත් තත්ත්වයක් විය හැකිය. ආධ්‍යාත්මික වශයෙන් නොදියුණු මනසක් ඇති තරුණ භික්ෂුව වුවද ගිහියා වුවද විනාශ වීම ස්වාභාවික තත්ත්වයකි. එවිට සිය වටිනාකම්, යුතුකම්, අනන්‍යතාවන් අමතක වේ. එසේ නැතිනම් ඒ කිසිවක් නොකතා හරී. එවැනි දේ තම නිදහසට බාධාවක් ලෙස සලකයි. මේ පිළිබඳ

ඉතා වටිනා පැහැදිලි කිරීමක් බුදුරදුන් විසින් චාතුම සූත්‍රයේදී සිදුකර ඇත. එහිදී බුදුරදුන් සඳහන් කරන්නේ දියට බසින්නෙකුට ඇති වන ආකාරයේ බිය සතරක් භික්ෂූන්ට ඇති බවයි. එම බිය හතර, 'ඌමි භය (තද දියරළ හේතුවෙන් ඇති වන භය), කුම්භීල භය (කිඹුලන් හේතුවෙන් ඇති වන භය), ආවට්ට භය (මිනිසුන් ඇදගන්නා දිය සුළි හේතුවෙන් ඇති වන භය), සුසුකා භය (මිනිසුන් අල්ලන මසුන්ගෙන් ඇති වන  භය)' යනුවෙනි. මෙම බිය හතර භික්ෂූන්ටද සිය පැවිදි ජීවිතය සම්බන්ධයෙන් උපදින ආකාරය බුදුරදුන් පැහැදිලි කර ඇත.[11]

බාල වූද තරුණ වූද මහලු වූද භික්ෂුව විසින් මාගේ ආකල්පය අන්‍ය වූවකැයි නිතර මෙනෙහි කරන්නැයි බුදුරදුන් දසධම්ම සූත්‍රයේදී භික්ෂූන්ට උවදෙස් දී ඇත. මෙකල ඇතැම් තරුණ භික්ෂූන් කෙරෙන් ප්‍රකට වන විවිධ විපරීතයන් වෙනස් කළ හැකි වන්නේ භික්ෂු ජීවිතයේ ආරම්භක අවධියේ ලබාදෙන ආකල්ප අනුවමය. එසේ නොමැතිව එය තරුණ අවධියේදී අවබෝධ කළ හැකි නොවේ. ඊට අමතරව තරුණ භික්ෂූන් අතර ධර්මඥානය ප්‍රගුණ කිරීමට නිසි ක්‍රමවේදයක් සැකසීම පිළිබඳ වැඩිහිටි, දැන උගත්කම් ඇති භික්ෂූන් විසින් කිසියම් කල්පවත්නා වැඩපිළිවෙළකට යොමු වීමද සාර්ථක විකල්පයක් ලෙස පෙනේ. එවිට තමන් තුළ හටගන්නා ප්‍රශ්න, ගැටලු කළමනාකරණයට අවශ්‍ය ධාර්මික ශක්තියත් පරිඥානයත් තරුණ භික්ෂුව තුළ ගොඩනැගේ. අද වන විට භික්ෂු ආකල්ප ප්‍රවර්ධනය ඉලක්ක කරගෙන පැවැත්වෙන විවිධ වැඩසටහන් ආදිය තවදුරටත් ක්‍රමවත් කරගැනීම මෙන්ම තරුණ භික්ෂුව පිළිබඳ ගිහි සමාජයේ ආකල්පය තරුණ භික්ෂූන්ටම අවබෝධ කරවීමේ ක්‍රමවේදයක් පිළිබඳවද සිතා බැලීම වැදගත් වේ. භික්ෂු අධ්‍යාපනයද මේ කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කිරීම වටී.

**සමාලෝචනය**

බුද්ධකාලීන සංඝ සංස්ථාවේ තරුණ භික්ෂූන් වහන්සේලා පිළිබඳ සිහිපත් කරමින් අරඹන ලද මෙම පැහැදිලි කිරීම අනුක්‍රමයෙන් වර්තමාන තරුණ භික්ෂු සමාජයේ විවිධ වර්ගීකරණ, උන්වහන්සේ පිළිබඳ සමාජ ආකල්පයේ විවිධතා, මෙකල තරුණ

භික්ෂු සංස්ථාවේ අවනතීන් හා ඊට හේතු මෙන්ම ඒවා යම් පමණකට හෝ සමනය කරගැනීමට ගත හැකි, ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවද පියවරෙන් පියවර සාකච්ඡා කරන ලදි. එහිදී විශේෂයෙන්ම බුද්ධ දේශනාවේ සඳහන් කරුණු හැකි සෑම විටම මූලාශ්‍රය වශයෙන් තබාගත් අතර පොදුවේ සමාජය පිළිබඳ විමසීමේදී පැහැදිලිවම පෙනෙන්නට තිබෙන තත්ත්වයන් පිළිබඳවද සාකච්ඡා කරන ලදි. මෙහිදී සඳහන් කළ සෑම කරුණකම අපේක්ෂාව වන්නේ වත්මන් භික්ෂු සමාජය පිළිබඳ වඩාත් සංයමයෙන් යුතු අපක්ෂපාතී විචාරයක, විමර්ශනයක යෙදීමයි. ඒ හැරෙන්නට භික්ෂු සංස්ථාව විවේචනය කිරීමේ නීරස ආශාව සංසිඳුවා ගැනීම උදෙසා නොවේ. සඟ සසුනේ චිරපැවැත්ම ඉතසිතින්ම පතන උගතුන්, බුද්ධිමතුන්, විචාරකයන් හා ගිහි පැවිදි වියතුන් විසින් මෙත් සිත් පෙරටුව, අපක්ෂපාතීව තවදුරටත් මෙවැනි අංශ පිළිබඳ සාකච්ඡා කළ යුතුය, අදහස් පළ කළ යුතුය. එහි අරමුණ විය යුත්තේ හුදු විවේචනවලට සීමා වී සංඝ සංස්ථාව අපහසුතාවට පත්කිරීම හෝ 'තරහ පිරිමහ ගැනීම' හෝ වෙනත් එවැනි අගතිගාමී අපේක්ෂාවක් නොවේ. උද්ගතව ඇති තත්ත්වයන් නිවැරදිව හඳුනාගැනීමත් ඒ පිළිබඳ ධර්මවිනයානුකූලවත් කාලීන අවශ්‍යතා අනුවත් සංවාදයක් ගොඩනැගීම හා එමගින් බහුතරයට පිළිගත හැකි, සාධාරණ මෙන්ම සංඝ සංස්ථාවේ ප්‍රගමණයට දායක වන මතවාදයක් ගොඩනැගීමත් මගහැරියනොහැකි කාලීන අවශ්‍යතාවකි.

## ආන්තික සටහන්

1. පඤ්ඤාවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස.
2. "සො ඛො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙණ යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං, කෙසමස්සුං ඔහාරෙත්‍වා කාසායානි වත්‍ථානි අච්ඡාදෙත්‍වා අගාරස්මා අනගාරියං පබ්බජිං...." අරියපරියෙසනසුත්ත, *මජ්ඣිමනිකාය* (මූලපණ්ණාසක), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලා (පුනර් මුද්‍රණ), 2006, 400 පිටුව.
3. *සංයුත්ත නිකාය 3*, පිණ්ඩොල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලා, 158 පිටුව.

4. "යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප ච්චයභෙසජ්ජපරික්ඛාරං තෙසං තෙ කාරා මහප්ඵලා භවිස්සන්ති. අම්හාකංඤ්චෙවායං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා ස උද්‍රයාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං. අත්තත්‍ථං වා භික්ඛවෙ සම්පස්සමා- නෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං. පරත්‍ථං වා... උභයත්‍ථං වා..." *අංගුත්තර නිකාය 4*, අග්ගික්ඛන්ධොපම සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලා, 2006, 474 පිටුව.
5. "න වණ්ණරූපෙන නරො සුජානො න විස්සසෙ ඉත්තරදස්සනෙන සුසඤ්ඤතානං හි වියඤ්ජනෙන අසඤ්ඤතා ලොකමිමං චරන්ති", *සංයුත්තනිකාය* - කොසලසංයුත්ත (අපුත්තකවග්ග), සත්තජටිල සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලා, 2006, 148 පිටුව.
6. "පතිරූපකො මත්තිකා කුණ්ඩලොව ලොහඩ්ඪමාසොව සුවණ්ණඡ- න්නො චරන්ති එකෙ පරිවාරඡන්නා අන්තො අසුද්ධා බහිසොභමානා", *එම.*
7. "අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බානගාමිනී
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො
සක්කාරං නාභිනන්දෙය්‍ය විවෙකමනුබ්‍රෑහයෙ" (ලාභ සෙවීමේ මාර්ගය එකකි. නිවන් මග අනිකකි. බුද්ධශ්‍රාවක වූ භික්ෂුව මේ මාර්ග දෙක වෙන වෙනම දැන ලාභසත්කාරවලින් සතුටු නොවන්නේය. විවේකය හෙවත් නිවන සොයන්නේය.) *ධම්මපද,* බාලවග්ග
8. "දාරුණො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං "උප්පන්නං ලාභසක්කාරසිලොකං ජහිස්සාම න වත නො උප්පන්නො ලාභසක්කාරසිලොකො චිත්තං පරියාදාය ඨස්සතී"ති. එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බං" (මහණෙනි, ලාභසත්කාර කීර්ති යන මේවා දරුණුය, කටුකය, ඵරුෂය, අනුත්තර වූ නිවන අවබෝධයට අන්තරායකර වූවකි. මහණෙනි, එබැවින් උපන් ලාභ සත්කාර කීර්තිය අත්හරින්නෙමු යැයිද උපන්නා වූ ලාභ සත්කාර කීර්තිය අපගේ කුසල සිතිවිල්ල අල්ලාගෙන හෝ නැතිකරමින් හෝ නොපවතීවා යැයිද හික්මිය යුතුය.) *සංයුත්තනිකාය*, ලාභසක්කාර සංයුත්ත
9. "ගිහීනමුපකරොන්තානං නිච්චමාමිසදානතො
කරොථ ධම්මදානෙන තෙසං පච්චුපකාරකං", *බුද්ධවංස අට්ඨකථා*
10. "සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසංකප්පගොචරා", *ධම්මපද*, යමකවග්ග
11. මජ්ඣිමනිකාය, චාතුම සූත්‍රය; මේ පිළිබඳ වැඩිදුර විස්තර සඳහා රේරුකානේ චන්දවිමල හිමි විසින් සම්පාදිත 'ශාසනාවතරණය' නම් කෘතියේ 'පැවිද්දන්ට ඇති භය සතරක්' යන කොටසකියවන්න